# වාර්ෂික වාර්තාව 2020

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ

ජාතික අධිකාරිය

428/11ඒ, පළමු මහල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
දුරකථන: +94112879539 ෆැක්ස්: +94112879540
ඊ - මේල්: witness.protection.srilanka@gmail.com

# පටුන


| | |
|---|---|
| සභාපතිතුමාගේ පණිවුඩය | 03 |
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය | 04 |
| දැක්ම සහ මෙහෙවර | 05 |
| විධායක සාරාංශය | 6-9 |
| හැඳින්වීම | 10-11 |
| අරමුණු | 12 |
| වින්දිතයන් හා සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් | 13-14 |
| අධිකාරියේ කාර්ය හා කර්තව්‍යන් | 15-17 |
| පොලිස් සහායක සහ ආරක්ෂක කොට්ඨාසය | 18-19 |
| කළමනාකරණ මණ්ඩලය - 2019 | 20-21 |
| කාර්ය මණ්ඩලය - 2019 | 22-26 |
| ✓ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය | |
| ✓ සහාය කාර්ය මණ්ඩලය | |
| • කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | |
| • රියදුරු | |
| • කාර්යාල කාර්ය සහායක | |
| • කාර්ය මණ්ඩල සාරාංශය | |
| කාර්ය සාධන වාර්තාව | 27-46 |
| මූල්‍ය ප්‍රගතිය (අවසාන ගිණුම්) | 47-67 |
| විගණන වාර්තාව | 68-75 |



## සභාපතිතුමාගේ පණිවුඩය

2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ හා ආරක්ෂා කිරීමේ පනත පාර්ලිමේන්තුවේ ඒකමතිකව සම්මත වීම ශ්‍රී ලංකා නීති ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථානයක් ලෙස සලකමි. අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට අපරාධ යුක්තිය පසිඳලීමේ යාන්ත්‍රණයට සහභාගී වීමේදී ද්විතීක වින්දිතභාවයට පත්වීම, අපරාධකරුවන්ගෙන් සිදුවන පීඩා, බලපෑම්, තර්ජනය කිරීම් ආදිය හේතුවෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් කඩවීම් ආරක්ෂා කිරීම සඳහා මෙම පනත බලාත්මක කිරීම තුලින් විධිමත් වැඩපිළිවෙළක් හඳුන්වාදීම ශ්‍රී ලංකාවට මෙන්ම අන්තර්ජාතික වශයෙන්ද ඉතාමත්ම වැදගත් වේ. එලෙස බල ගැන්වූ අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ හා ආරක්ෂා කිරීමේ පනත ප්‍රකාරව, 2016 ජනවාරි මස 08 වන දින අප ආයතනය ආරම්භ කරන ලද අතර, 2016 මැයි මස 18 වන දින සිට බලපැවැත්වෙන පරිදි අධිකරණ ඇමතිතුමාගේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක් ලෙස අතිවිශේෂ ගැසට් අංක 1967/8 මඟින් ස්ථාපනය කරන ලදී.

මූලික අවධියේ දී එනම් 2016 සහ 2017 වර්ෂයන් තුළදී නවා ආයතනයක් ලෙස පිහිටවූ අප ආයතනය 2018, 2019 වර්ෂයන් සහ 2020 වර්ෂයේදීත් කොවිඩ් වසංගතය පැවතියද අපගේ සේවාවන් කාර්යක්ෂමව සහ ඵලදායීව කර ගැනීමට හැකිවීම අප ලද භාග්‍යයක් කොට සලකමි. පනතේ කාර්යයන් සහ කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා පිහිටුවන ලද අප ජාතික අධිකාරිය සහ අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාසය මේ වන විට ඉතාමත් සක්‍රීයව රටේ පුරවැසියන් වෙනුවෙන් කටයුතු කරනු ලබයි. මෙම කෙටි කාලය තුල ලබා ඇති ප්‍රගතිය මෙන්ම අනෙකුත් ආයතන සමග සහසම්බන්ධතාවයෙන් ක්‍රියා කිරීම තුලින් ලැබූ අත්දැකීම් සමග ඉදිරියට ගමන් කිරීම අපගේ ඒකායන අරමුණ වේ.

මෙම නීතිය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීමට සහ ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙන් ලබාදුන් දායකත්වය සහ ආයතනයේ ව්‍යුහාත්මක වටපිටාව සකස් කිරීම මෙන්ම පවත්වාගෙන යාමට ඉවහල්වන රාජ්‍ය දායකත්වය සිහිපත් කරන්නේ ඉමහත් සතුටිනි.

2020 වාර්ෂික වාර්තාව සඳහා මෙම පණිවිඩය ගෙන ඒමට ලැබීම ඉමහත් සතුටක් ලෙස සලකන අතර අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් සුරකින ශ්‍රී ලංකාවක් බිහිකරනු වස් අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය යන ගමන් මඟ තුළ පෙළගැසී සිටි කළමනාකරණ මණ්ඩලය, අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු ආයතනික කාර්යය මණ්ඩලය ඉතා ගෞරවයෙන් සිහිපත් කරමි.

සුභද කේ. ගමලත්
සභාපති



## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය

2020 වර්ෂයේදී අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ ප්‍රධාන අරමුණු සාක්ෂාත් කර ගැනීම සිහිගැන්වීම සඳහා මෙය විශේෂ අවස්ථාවක් කර ගන්නා අතරම වාර්ෂික වාර්තාව සඳහා මෙම කෙටි පණිවිඩය මා ගෙන එන්නේ ඉමහත් සංතෘප්තියෙනි.

2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත බලගන්වමින් අපරාධයක වින්දිතයන් සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය 2016 මැයි මස 18 වන දින ආරම්භ කිරීමෙන් අනතුරුව ගතවූ කෙටි කාලය තුළදී සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කරගෙන ඇති බව කිව යුතුය. 2018 වර්ෂයේදී 31ක් වූ අධිකාරියේ කාර්යමණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව 2020 වර්ෂය වන විට 36ක් දක්වා වර්ධනය කර ගැනීමට හැකි වූ අතර අධිකාරියේ තාක්ෂණික සහ පරිපාලන කටයුතු මෙහෙයවීමේලා ඉවහල් වන නව තනතුරු ස්ථාපිත කිරීම මෙන්ම අධිකාරියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේලා ඉවහල් වන කාර්යයන් කොවිඩ් වසංගතය හමුවේ වුවද මුල පිරීමට හැකිවීම අධිකාරියේ ප්‍රගමනයට හේතු වන බව මාගේ හැඟීමයි.

2017, 2018 සහ 2019 වර්ෂවලදී අධිකාරියට ලැබුණු පැමිණිලි සංඛ්‍යාව පිළිවෙළින් 49ක්, 86ක් සහ 252ක් වූ අතර 2020 වර්ෂයේදී ලැබූ පැමිණිලි සංඛ්‍යාව කොවිඩ් වසංගතය හේතුවෙන් 157ක් දක්වා අඩු වී ඇත. අප අධිකාරිය මගින් දිවයිනේ සෑම පළාතක්ම ආවරණය වන පරිදි කරන ලද වැඩසටහන් වලින් මෙන්ම අධිකාරිය ලබා දෙන සේවාවන් හා සම්බන්ධ පොස්ටර් දැන්වීම් පුවරුවල පලකිරීම තුලින් මෙලෙස පැමිණිළි ලැබීමට හේතු වී ඇත.. එලෙසම, 1985 මගින් අධිකාරිය ක්ෂණිකව සම්බන්ධ කරගත හැකි දුරකතන අංකය හඳුන්වාදීම සහ ප්‍රවර්ධනය කිරීම තුලින් 2020 වසර තුල ඇමතුම් 841ක සංඛ්‍යාවක් කොවිඩ් වසංගත තත්වය හමුවේ වුවද ලැබීම සැලකියයුතු කරුණකි.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල (UNDP), එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (Unicef), ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් (Transparency International)ආයතනය, නීතිපති දෙපාර්තමේන්තුව, අධ්‍යාපන අමාත්‍යාංශය, පොලිස් දෙපාර්තමේන්තුව, ජනමාධ්‍ය අමාත්‍යාංශය වැනි දේශීය හා විදේශීය ආයතන සමඟ එක්ව කටයුතු කිරීම මගින් අප අධිකාරියට සිය අභිමතාර්ථ සඵල කර ගැනීමට හැකි වීමද අගයකොට සලකමි. තවද අධිකාරිය සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කිරීම සඳහා කටයුතු කිරීමට හැකිවීම සැලකිය යුතු කරුණකි.

අපරාධවලට ලක් වූවන් සහ සාක්ෂිකරුවන් හට නොබියව සිය අයිතිවාසිකම් ආරක්ෂා කර ගනිමින්, නීතියේ ආධිපත්‍යය තහවරු වන පරිදි සිය සමාජ වගකීම ඉටු කිරීම සඳහා අවශ්‍ය ආරක්ෂාව සහ සහය ලබා දීම මගින් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක සාධාරණීය ගුණාංග ප්‍රවර්ධනය තුලින් ඔවුන්ගේ හිමිකම් ලබා දීම අධිකාරියේ අපේක්ෂාව වන අතර ඒ සඳහා උපරිම දායකත්වය දැක්වීමට අප කැප වන බවද මෙහි ලා විශේෂයෙන් සඳහන් කරමු.

උදයකුමාර අමරසිංහ

අධ්‍යක්ෂ ජනරාල්

✓ <u>දැක්ම</u>

**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් සුරකින ශ්‍රී ලංකාවක්**

✓ <u>මෙහෙවර</u>

**අපරාධයක වින්දිතයන්ගේ හා සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් සුරක්ෂිත කිරීම හා ප්‍රවර්ධනය කිරීම, බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම**

# විධායක සාරාංශය

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 428/11 ඒ දරන ස්ථානයෙහි පළමු මහලෙහි 2016 සිට ස්ථාපිත කර ඇත. අධිකාරියේ 2020 වර්ෂයේ නොවැම්බර් මස සිට කලමනාකරණ මණ්ඩලය, අතිගරු ජනාධිපතිවරයා විසින් තෝරා පත් කරනු ලැබූ සාමාජිකයන් පස් දෙනා (05) වශයෙන් ජනාධිපති නීතිඥ සුහද කේ.ගමලත් මහතා, උදයකුමාර අමරසිංහ මහතා, වෛද්‍ය අජිත් තෙන්නකෝන් මහතා, වෛද්‍ය නීල් ප්‍රනාන්දු මහතා, නීතිඥ සමන් සේනාධීර මහතා වූ අතර නිල බලයෙන් පත්වන සාමාජිකයන් හත් දෙනා (07) දෙනා වශයෙන් ජනාධිපති නීතිඥ සුසන්ත බාලපටබැඳි මහතා, එල්. එස්. පතිනායක මහතා, නීතිඥ එච්.ජී.හුසේන් මහතා/ වෛද්‍ය නිමල් කරුණාසිරි මහතා, නීතිඥ පියුමන්ති පීරිස් මහත්මිය, එන්. එච්. එම්. ඩබ්ලිව්. එන්. හේරත් කුමාරි මහත්මිය, එම්. එස්. පී. සූරියප්පෙරුම මහත්මිය සමන්විත විය. අතිගරු ජනාධිපති තුමා විසින් ජනාධිපති නීතිඥ සුහද කේ. ගමලත් මහතා අධිකාරියේ සභාපතිවරයා ලෙස පත් කරන ලදී.

අධිකාරියට අනුමත 56ක කාර්ය මණ්ඩලයෙන් 2020 වන විට නිලධාරින් 36 දෙනෙකු බඳවාගෙන සිටි අතර කළමනාකරණ සේවා දෙපාර්තමෙන්තුව මගින් නීති නිලධාරී තවත් එක් තනතුරක් සහ අධ්‍යක්ෂ (රැකවරණ) සහ අධ්‍යක්ෂ (සහාය සේවා) තනතුරු දෙකට අදාළ බඳවා ගැනීමේ පටිපාටි අනුමත කරවා ගන්නා ලදී. ආයතනයේ කාර්ය මණ්ඩලයේ නිපුණතා වර්ධනය උදෙසා අදාළ ක්ෂේත්‍රයන්හි නිපුණතා සංවර්ධන වැඩමුළු සඳහා කාර්ය මණ්ඩලය යොමු කරන ලදි. 2020 නොවැම්බර් මස කලමණාකරන මණ්ඩලය පත්වූ බැවින් 2020 වර්ෂය තුල කළමනාකරණ මණ්ඩල රැස්වීම් 2 ක් පමණක් පැවැත්වීමට හැකි වූ අතර අධ්‍යෂකවරුන්ගේ සහාභාගීත්වයෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ රැස්වීම් 10ක් පැවැත්වින.

2020 වර්ෂය තුළ අධිකාරිය වෙත ලැබුණු පැමිණිලි ගණන 157ක් වන අතර, එය 2019 වසරේ ලද පැමිණිලි 252 සමග සංසන්දනාත්මකව බලන කල, කොවිඩ් වසංගතය හේතුවෙන් 60% කින් අඩු වී ඇත. ඒ අතර, නීති අංශය විසින් වරද විමර්ශනය සඳහා පොලිස් කොට්ඨාසයට හෝ වෙනත් පොලිස් ස්ථානයකට යවන ලද පැමිණිලි 34 ක් ද, නීති අංශය විසින් අධිකාරියේ රැකවරණ අංශයට යොමු කල ලිපිගොනු සංඛ්‍යාව 53 ක් ද, අධිකාරියෙන් විවිධ සහාය ලබා ගැනීම සඳහා ඉල්ලුම් කරන ලදුව සහාය ලබා දෙමින් පවතින සහ සහාය ලබාදී අවසන් කල පැමිණිලි සංඛ්‍යාව 11 ක් ද, අධිකාරියේ විෂය පථයට අයත් නොවන පැමිණිලි සංඛ්‍යාව 48 ක් ද වේ. 2020 වසරේ අධිකාරියට ලැබුණු පැමිණිලි අතරින් සම්පූර්ණයෙන්ම කටයුතු අවසන් කර ඇති පැමිණිලි ගණන 44 ක් වේ. තවද අධිකරණය ඉදිරියේ වින්දිත බලපෑම් ප්‍රකාශ ගොනු කිරීම මගින් අධිකරණ මාර්ගයෙන් වින්දිතයන්ට හානි පූරණ වන්දි ලබා දීමට සහාය වීම, අධිකරණයේ විභාග වන නඩුවල සාක්ෂි සමකාලීන ශ්‍රව්‍ය දෘෂ්‍ය සම්බන්ධක මගින් දුරස්ථ ස්ථානවල සිට මෙහෙවීමට සහාය වීම සහ අධිකාරියට විරුද්ධව විවිධ තැනැත්තන් විසින් පවරා ඇති නඩු කටයුතුවල දී අවශ්‍ය නෛතික පියවර ගැනීම ද නීති අංශය විසින් සිදු කරන ලදී. 2019 මාර්තු මස සිට අධිකාරිය ක්ෂණිකව සම්බන්ධ කරගත හැකි දුරකතන අංකය ලෙස 1985 විදුලි සංදේශ නියාමන කොමිසම මගින් ලබාගත් අතර ඒ සඳහා 2020 වසර තුල ලැබුණු ඇමතුම් සංඛ්‍යාව 814 වේ.

2020 වසරේ ජනවාරි මස 01 වන දින සිට 2020 දෙසැම්බර් මස 31 දක්වා රැකවරණ අංශය වෙත යොමු කරන ලද ඉල්ලීම් සහ පැමිණිලි 53 අතුරින්, විමර්ශනය වෙමින් පවතින පැමිණිලි 36 ක් ද, ආරක්ෂාව ලබා දෙමින්

පවතින සහ ආරක්ෂාව ලබා දෙන ලද පැමිණිලි 14 ක් ද, අවසන් කරන ලද පැමිණිලි 02 ක් ද වේ. එමෙන්ම, පනතේ 24 වන වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභා නියෝග 38 ක් සහ අධිකරණ නියෝග 5ක් අධිකාරිය වෙත ලැබී ඇති අතර ඒවා සඳහා ආරක්ෂාව ලබා දෙමින් පවතින නියෝග 09 ක්, තර්ජන තක්සේරු සඳහා යොමු කර ඇති සහ අන්තර් ආරක්ෂාව ලබා දීමට උපදෙස් ලබා දී ඇති නියෝග 17 ක්, තර්ජන තක්සේරු සඳහා පොලිස් කොට්ඨාසය වෙත යොමු කර ඇති නියෝග 02 ක්, තර්ජන තක්සේරු වාර්තා ප්‍රකාරව තර්ජනයක් පවතින බැවින් ආරක්ෂාව ලබා දෙන නියෝග 02 ක්, ආරක්ෂාව ලබා දී බහා තබන ලද නියෝග 02 ක්, බහා ලබන ලද නියෝග 11 ක් ද වශයෙන් කටයුතු කරගෙන යනු ලැබේ. තවද පනතේ 4(1) වගන්තිය ප්‍රකාරව අධිකරණ හෝ අර්ධ අධිකරණ කටයුත්තකට සහභාගී වීම සඳහා අධිකරණය වෙත යාමේදී ආහාර, නවාතැන් සහ ප්‍රවාහනය වෙනුවෙන් වැය වන වියදම් අධිකාරියේ ආරක්ෂණ අරමුදලෙන් ගෙවන ලෙස අධිකරණයෙන් ඉල්ලීමක් ලද විට උපරිමය රුපියල් පන්දහසකට යටත්ව එම වියදම් ගෙවීමට 2019.11.15 වන දින පැවති අධිකාරියේ කළමණාකරණ මණ්ඩල රැස්වීමේදී තීරණය අනුව ඉල්ලීම් දෙකක් 2020 වර්ෂයේ ඉදිරිපත් වූ අතර ඒ සඳහා මුදල් ලබා දීම සිදු කෙරුණි.

2018 සහ 2019 වර්ෂ වලදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල (UNDP) මගින් රුපියල් මිලියන 40ක ප්‍රදානයක් ලද අතර ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට යොදවා ගත් අතර එහිදී ප්‍රධාන වශයෙන්ම පනතෙහි (13) වගන්තිය ප්‍රකාරව ජාතික අධිකාරියේ නිලධාරීන් සහ සහායක සහ ආරක්ෂක කොට්ඨාසයේ නිලධාරීන් තාක්ෂණික දැනුම වැඩිදියුණු වීම සඳහා පුහුණු කිරීම මෙන්ම ළමා ආරක්ෂක නිලධාරීන්, පොලිස් විශේෂ විමර්ශන ඒකකය නිලධාරීන්, නීතීඥ සංගමයේ නීතීඥවරුන්, නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ අධිනීතීඥවරුන්, සිවිල් සංවිධාන ආයතන නිලධාරීන්, අධ්‍යාපන අමාත්‍යාංශයේ කළාප අධ්‍යාපන නිලධාරීන්, හම්බන්තොට සහ ගාල්ල දිස්ත්‍රික් රාජ්‍ය නිලධාරීන්, අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියට සහ සහායක සහ ආරක්ෂක කොට්ඨාසයට අළුතින් බඳවා ගත් නිලධාරීන්, පරිවාස හා ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්, බස්නාහිර පළාත් අපරාධ හා සුළු අපරාධ ස්ථානාධිපතිවරුන්, සහ බස්නාහිර පළාත් කාන්තා හා ළමා ආරක්ෂක නිලධාරිනියන් දැනුවත් කිරිමේ සහ සංවේදී කිරිමේ වැඩසටහන් සිදු කරන ලදි. මීට අමතරව එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලේ (Unicef) මගින් සෘජුවම ආධාර ලබා දී අධිකාරියේ සංවිධානය කරන ලද වැඩමුළුවක් ළමා වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා අධිකාරියේ තාක්ෂණික අංශවල නිලධාරීන් සහ ඉහල පොලිස් නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් 2019 වර්ෂයේදී පවත්වන ලදී. එම කාර්යයන් තවදුරටත් ඉදිරියට ගෙනයමින් ජනමාධ්‍යවේදීන් සහ ජනමාධ්‍ය ආයතන ප්‍රධානීන් 86 ගේ සහභාගිත්වයෙන් අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත පිළිබදව දැනුවත් කිරීමේ වැඩසටහනක් 2020 ජනවාරි 9 වන දින බත්තරමුල්ලේ Waters' Edge හෝටලයේදී පවත්වන ලදී. 2020 නොවැම්බර් මස අධිකාරියට කලමණාකරන මණ්ඩලයක් පත් කරන ලද අතර අධිකාරියේ වැඩ කටයුතු පහසුවෙන් ඉදිරියට කරගෙන යාමේ අදිටනින් 2020 දෙසැම්බර් 19 වන දින තාක්ෂණික වැඩමුළුවක් කලමණාකරන මණ්ඩලයේ සාමාජිකයින් සහ තාක්ෂණික අංශයන්හි අධ්‍යක්ෂකවරුගේ මෙන්ම පොලිස් ආරක්ෂක කොට්ඨාශයේ ඉහල නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලදි. මේ සඳහා අධිකාරියේ සභාපතිතුමා සහ කලමණාකරන මණ්ඩලයේ සාමාජිකයින් මෙන්ම UNDP ආයතනයේ තාක්ෂණික විශේෂඥතුමිය ද දේශන සඳහා සම්පත් දායකත්වය ලබා දෙන ලදී. මෙම දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් මගින් අප ආයතනයට අදාළ වූ නීතිය සවිබල ගැන්වීමේ ක්‍රියාවලියට සෘජුවම දායක

වන පාර්ශවයන් සඳහා විශේෂිත වූ දේශනමාලා රාශියක් අප ආයතනයේම කළමනාකරණ මණ්ඩලයේ විද්වතුන් විසින් ඔවුන්ට ලබා දෙන ලදි. එම සියලුම වැඩසටහන් වලදි අප අධිකාරියේ තාක්ෂණික කාර්යයන් ඇතුළත් අත්පත්‍රිකා සහ සරල සංක්ෂිප්ත පත්‍රිකා සහ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් (Transparency International) ආයතනයෙන් ලබා දුන් අත්පොත බෙදා දෙන ලදී. තවද ප්‍රජාවිශෝධන, ළමා හිමිකම් ප්‍රවර්ධන, පරිවාස නිලධාරීන්හට සහ බස්නාහිර පලාතේ අපරාධ, සුලු පැමිණිලි සහ කාන්තා හා ළමාකටයුතු පොලිස් ස්ථානාධිපතිවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් කිරීමට බලාපොරොත්තු වුවද Covid-19 වසංගත තත්වය සහ අධිකාරියේ එවකට කළමණාකරන මණ්ඩලයක් පත්කර නොමැති විම යන හේතු මත ඒවා කිරීමට නොහැකි විය. එනමුත්, අප ආයතනය මගින් සැකසූ පෝස්ටර් දිවයිනේ සියලුම ජාතික පාසල් (353) සඳහා සිංහල සහ දෙමළ පොස්ටර් 2020 ජනවාරි මස පැවති විදුහල්පතිවරුගේ සම්මේලනයේදි ඔවුන් දැනුවත් කර බෙදා දුන් අතර සියලුම පළාත් පාසල් (10,366) අයත් පළාත්හි අධ්‍යාපන අධ්‍යෂකවරුන් හමුවී (උතුරු පළාත හැර) ඔවුන් දැනුවත් කරමින් සිංහල සහ දෙමළ පොස්ටර් 13,000 පමණ බෙදා දෙන ලදී. දිවයිනේ සියලුම පොලිස් ස්ථානයන් (492) සඳහා සිංහල සහ දෙමළ පොස්ටර් 2,000 පමණ අදාල පලාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් හමුවී (උතුරු පළාත හැර) ඔවුන් දැනුවත් කරමින් ලබා දෙන ලදී. අධිකරණ සංකීර්ණ 185කට (දිස්ත්‍රික් උසාවි, මහේස්ත්‍රාත් උසාවි, ආදිය) සිංහල සහ දෙමළ පොස්ටර් 800 පමණ ලබා දෙන ලදී. දැන් ඒවා එම පරිශ්‍රයන් වල දැන්වීම් පුවරුවල ප්‍රදර්ශනය කෙරේ. වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහය දීමේ සහ ආරක්ෂා කිරීම පිළිබඳව පර්යේෂණ සිදු කිරීම හා මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම සඳහා පොත්පත් මිලදී ගැනීම සිදු විය. UNDP ආයතනය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අපරාධ විද්‍යා අධ්‍යනාංශය සමග කරනු ලබන පර්යේෂණය සඳහා සේවා දායකත්වය ලබා දීම ද සිදු කරනු ලැබිණ. අධිකාරිය සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කිරීම සඳහා සංකල්ප පත්‍රිකාව (Concept Note), යෝජනා මලාව (Proposal) සහ යොමුකිරීමේ අනුදේශ පත්‍රිකාව (Terms of Reference) සකස් කර ලද අතර එය කිරීම සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය තොරා ගන්නා ලදී.

තවද පනතේ 29 වගන්තිය ප්‍රකාරව අධිකාරියේ ආරක්ෂණ අරමුදල ස්ථාපිත කර ඇති අතර 2020 දෙසැම්බර් 31 වන විට එය රුපියල් මිලියන 10.87ක් දක්වා වර්ධනය වී ඇත. 2020 වසරේ මූල්‍ය ප්‍රගතිය ලෙස රජයේ පුනරාවර්තන වියදම් 100% ද රජයේ ප්‍රාග්ධන වියදම් 35% ද වශයෙන් ලබා කර ගන්නා ලදී.

# හැඳින්වීම

වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා විධිමත් නෛතික රාමුවක් සහ වැඩපිළිවෙළක් හඳුන්වා දීම මගින් අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය සවිබල ගැන්වීම සඳහා පාර්ලිමේන්තුව විසින් ඒකමතිකව සම්මත කරන ලද 2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ, අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය පිහිටුවා ඇත. බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 428/11ඒ දරන ස්ථානයෙහි පළමු මහලෙහි වර්ග අඩි 5300ක පමණ භූමි ප්‍රමාණයකින් යුක්ත ගොඩනැගිල්ලක් තුල මෙම ආයතනය පිහිටුවා ඇති අතර, එවකට අතිගරු ජනාධිපතිතුමා විසින් 2016.01.08 වන දින අධිකාරිය උත්සවාකාරයෙන් විවෘත කරන ලදි. පසුව අංක 1966/02 හා 2016.05.09 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය මගින් උක්ත අධිකාරිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43(2) ව්‍යවස්ථාව යටතේ 2016.04.27 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගරු අධිකරණ අමාත්‍යවරයා යටතට පවරා ඇත. ඒ අනුව අධිකරණ අමාත්‍යවරයා විසින් අංක 1967/08 හා 2016.05.16 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය මගින් 2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීම පනතෙහි සියලු කොටස් 2016.05.18 දින සිට ක්‍රියාත්මක කොට ඇත.

පනතෙහි 12(ආ) වගන්තිය ප්‍රකාරව අතිගරු ජනාධිපතිතුමා විසින් අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය පත්කර ඇති අතර එය අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්, පොලිස් දෙපාර්තමේන්තුව භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්, කාන්තා කටයුතු විෂය හා ළමා කටයුතු විෂය භාර අමාත්‍යවරුන්ගේ අමාත්‍යාංශවල ලේකම්වරු හෝ ඔවුන්ගේ නියෝජිතයින්ගෙන් හා මානව හිමිකම් කොමිෂන් සභාවේ සමාජිකයකු, නීතිපතිවරයාගේ නියෝජිතයකු සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ධූරය දරන පොලිස්පතිවරයාගේ නියෝජිතයකු ඇතුළත්වන නිල බලයෙන් පත්වන සාමාජිකයන් හත් (7) දෙනකුගෙන්ද අපරාධවේදය, අපරාධ යුක්ති පද්ධතිය, මානව හිමිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරිම හෝ වෛද්‍ය විද්‍යාව ආශ්‍රිත හෝ ඒ හා සම්බන්ධිත වෘත්තීන්හි අධ්‍යාපනික හෝ වෘත්තිමය සුදුසුකම් ලත් සහ පළපුරුද්දක් ඇති තැනැත්තන් අතරින් ජනාධිපතිවරයා විසින් තෝරා පත් කරනු ලබන සාමාජිකයින් පස් දෙනෙකුගෙන් ද සමන්විත වේ. අතිගරු ජනාධිපතිතුමා විසින්, මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු වන සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතීඥ සුහද කේ. ගමලත් මහතා 2020 නොවැම්බර් මස සිට අධිකාරියේ සභාපතිවරයා ලෙස පත් කරන ලදී.

**අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ පනතෙහි අරමුණු පහත පරිදි වේ.**

**(පනතෙහි (2) වගන්තිය)**

1. අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් දැක්වීම, ස්ථිර කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ එම අයිතිවාසිකම් සහ හිමිකම් ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම, බලාත්මක කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා යාන්ත්‍රණයක් සැලසීම.
2. අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහාය සහ ආරක්ෂාව ලබාදීම.
3. අපරාධයක වින්දිතයන්ට එරෙහිව වරදක් සිදුකිරීම නිසා වරදකරු වූ තැනැත්තන්ගෙන් වින්දිතයන් හට වන්දි මුදල් ලබාගැනීමට සැලැස්වීම.
4. ප්‍රතිෂ්ඨාපනය, වන්දි, හානිපූරණය සහ පුනරුත්ථාපනය ඇතුළුව , අපරාධයක වින්දිතයන් හට සහන ලබාගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම.
5. අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් වර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම උදෙසා වූ, රජයේ අධිකරණ නිලධරයන්ගේ සහ රජයේ නිලධරයන්ගේ කාර්යය සහ වගකීම දැක්වීම.
6. අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට එරෙහිව සිදුකළ හැකි වැරදි සඳහන් කිරීම සහ ඒ වැරදි සිදු කරන තැනැත්තන් උදෙසා පැනවිය හැකි දණ්ඩන නියම කිරීම.
7. අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමට අදාළව යහපත් ප්‍රතිපත්ති පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම.

## අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම්

**අපරාධයක වින්දිතයකු සතු අයිතිවාසිකම් (පනතෙහි (3)වගන්තිය)**

1. සමාන ව සාධාරණ ව වින්දිතයාගේ ගරුත්වයට සහ පෞද්ගලිකත්වයට සලකවාගනු ලැබීමට (3 (1) (අ) වගන්තිය)
2. ළමා වින්දිතයෙකු වන විටෙක ඔහුගේ උපරිම යහපත තහවුරු වන ලෙස සලකවාගනු ලැබීමට (3 (1) (ආ) වගන්තිය)
3. වින්දිතයකු වීම නිසා යම් අලාභයක් සිදු වුණි නම්, ඒ සඳහා අප්‍රමාද ව සුදුසු සහනයක් ලබා ගැනීමට(3 (1) (ඇ) වගන්තිය)
4. මානසික හෝ කායික හිංසාවක් සිදු වුණි නම් ඒ සඳහා වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට (3 (1) (ඉ) වගන්තිය)
5. තර්ජන හා බියගැන්වීම්වලින් නිසි ආකාරයෙන් ආරක්ෂා වීමට (3 (1) (ඈ) වගන්තිය)
6. වින්දිතයා ඉල්ලීමක් කර ඇති විටදී, අධිකාරිය මගින් හෝ කොට්ඨාසය මගින් නීතිමය තත්වයන් පිළිබඳව දැනුවත් වීමට, පැමිණිල්ලේ විමර්ශනය පිළිබඳ දැනුවත් වීමට, අධිකරණ කටයුතුවල ප්‍රගතිය පිළිබඳව දැනුවත් වීමට අවශ්‍ය වෛද්‍ය, සමාජ සේවා සහ අනෙකුත් සේවාවන් පිළිබඳව දැනුවත් වීමට(3 (1) (ඊ) වගන්තිය)
7. පොලිස් නිලධාරියෙකු ලවා පැමිණිල්ලක් වාර්තාගත කර ගැනීමට සහ එම පැමිණිල්ල පූර්ණ ලෙස විමර්ශනය කරවා ගැනීමට(3 (1) (උ) වගන්තිය)
8. වරදකට අදාළ ව විවිධ විමර්ශනයන් සිදු කෙරෙන කාලසීමාවේදී අදාළ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරියෙකු වෙතට නීතිඥයෙකු මගින් පෙනී සිට කරුණු ඉදිරිපත් කිරීමට (3 (1) (ඌ) වගන්තිය)
9. පොලීසිය මගින් මහේස්ත්‍රාත් අධිකරණය වෙත ගොනු කළ යුතු වාර්තාවල සහතික පිටපත් ලබා ගැනීමට(3 (1) (එ) වගන්තිය)
10. වින්දිතයාට එරෙහි ව කර ඇති වරදකට අදාළ ව නඩු කටයුත්තක් පවත්වා ගෙන යාමට පෙර සහ එය පවත්වා ගෙන යන කාලසීමාව තුළ නීතිපතිවරයා වෙත කරුණු ඉදිරිපත් කිරීම පිණිස නීතිඥයෙකු මාර්ගයෙන් ලිපි යැවීමට හෝ නියෝජනයන් සිදු කිරීමට (3 (1) (ඒ) වගන්තිය)
11. අදාළ වරද සම්බන්ධයෙන් විමර්ශන පවත්වන විමර්ශකයෙකු වෙත ලිපි යැවීමට හෝ නියෝජනයන් සිදු කිරීමට සහ එම නියෝජනයන්ට ප්‍රතිචාරයන් ලබා ගැනීමට (3 (1) (ඔ) වගන්තිය)
12. වරද සිදු කරනු ලැබූ තැනැත්තා වරදකරු කිරීමෙන් පසු එය දඬුවම තීරණය කිරීමට පෙර, එම වරද වින්දිතයාගේ ජීවිතයට බලපෑ ආකාරය පිළිබඳව පුද්ගලිකව හෝ නීතිඥයෙකු මාර්ගයෙන් අධිකරණයට දැන්වීමට (3 (1) (ඕ) වගන්තිය)
13. වරදකරු අභියාචනයක් හෝ ප්‍රතිශෝධනයක් ඉදිරිපත් කර තිබෙන විට එම වරද වින්දිතයාගේ ජීවිතයට බලපෑ ආකාරය පිළිබඳ ව පුද්ගලික ව හෝ නීතිඥයෙකු මාර්ගයෙන් අධිකරණයට කරුණු දැන්වීමට (3 (1) (ජ) වගන්තිය)
14. වරද සිදු කරනු ලැබූ තැනැත්තාට සමාවක් දීම සලකා බැලීමක දී හෝ දඬුවමක් ලිහිල් කිරීම සලකා බැලීමක දී ඒ පිළිබඳව දැන්වීමක් ලැබීමට සහ එම වරද වින්දිතයාගේ ජීවිතයට බල පෑ ආකාරය පිළිබඳ ව පුද්ගලිකව හෝ නිතිඥයෙකු මාර්ගයෙන් හෝ අදාළ අධිකාරියට දැන්වීමට (3 (1) (ට) වගන්තිය)

**අපරාධයක වින්දිතයකු සතු හිමිකම් (පනතෙහි (4) වගන්තිය)**

1. යම්කිසි අධිකරණ කටයුත්තකට සහභාගි වීම නිසා, අපරාධයක වින්දිතයකුට දරන්නට සිදු වූ වියදම් වෙනුවෙන් අධිකාරියෙන් කිසියම් මුදලක් ලබා ගැනීමට(4 (1) වගන්තිය)
2. අපරාධයක වින්දිතයකු වීම නිසා අත්විඳි කායික හෝ මානසික හිංසාවන් සඳහා සුදුසු වෛද්‍ය ප්‍රතිකාර, උපදේශන සේවා රජයෙන් ඉල්ලා සිටීම (4 (2) වගන්තිය)
3. රජයට වෛද්‍ය ප්‍රතාකාර හෝ උපදේශන සේවා ලබා නොදිය හැකි අවස්ථාවක දී එකී අවශ්‍යතා පෞද්ගලික අංශයෙන් ලබා ගැනීම සඳහා අධිකාරියට ඉල්ලීමක් කිරීමට (4 (3) වගන්තිය)

**සාක්ෂිකරුවෙකු සතු හිමිකම් (පනතෙහි (5) වගන්තිය)**

1. සාක්ෂිකරුවන්ගේ ගෞරවයට සහ පුද්ගලිකත්වයට සාධාරණයක් වන සේ සහ ගෞරවයෙන් සලකවා ගනු ලැබීමට(5 (1) වගන්තිය)
2. මූලික අයිතිවාසිකමක් කඩ කිරීමටකට අදාළ ව තොරතුරු සැපයීම, යම් වරදක් පිළිබඳ ව විමර්ශනයක් පවත්වන අතරතුරදී ස්වේච්ඡාවෙන් ප්‍රකාශනයක් කිරීම හෝ යම්කිසි වරදක් සිදු කිරීමකට හෝ මූලික අයිතිවාසිකම් කඩ කිරීමකට අදාළ ව අධිකරණයක දී සාක්ෂි ලබා දීමේ දී සාක්ෂිකරු කිසිදු හිරිහැරයකට ලක් නොවී සිටීමේ හිමිකම. එවැන්නකට එරෙහි ව ආරක්ෂාව ලබා ගැනීමට සාක්ෂිකරුවෙකුට හිමිකමක් ඇත.(5 (1) වගන්තිය)

**තොරතුරු සපයන්නන් සතු හිමිකම් (පනතෙහි (6) වගන්තිය)**

සාක්ෂිකරුවකු වන හෝ නොවන හෝ යම්කිසි පුද්ගලයෙකු තමාගේ සේවා ස්ථානයේ වන වරදක් හෝ මූලික අයිතිවාසිකමක් කඩ කිරීමකට අදාළ ව තොරතුරු සැපයීම, ඒ පිළිබඳ ව පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම හෝ ඊට අදාළ ව අධිකරණයක දී සාක්ෂි ලබා දීම හේතු කොට ගෙන එකී පුද්ගලයාට කිසිදු හිරිහැරයක් හෝ රැකියාවේ අහිතකර වෙනසකට එරෙහි ව ආරක්ෂාව ලබා ගැනීමට හිමිකමක් ඇත.(6 වන වගන්තිය)

## අධිකාරියේ කාර්යය සහ කර්තව්‍ය

## (පනතෙහි (13) වගන්තිය)

1. අපරාධයක වින්දිතයන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් හඳුනා ගැනීම සහ ඒවාට ගෞරවය කිරීම ප්‍රවර්ධනය කිරීම.
2. සාක්ෂිකරුවන්ගේ හිමිකම් හඳුනා ගැනීම සහ ඒවාට ගෞරව කිරීම ප්‍රවර්ධනය කිරීම.
3. අපරාධයක වින්දිතයන්ගේ අයිතිවාසිකම් හා සාක්ෂිකරුවන්ගේ හිමිකම් ආරක්ෂා කිරීම හෝ ආරක්ෂා කිරීමට සැලැස්වීම.
4. අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ යම් අයිතිවාසිකමක් හෝ හිමිකමක් කඩ කරන ලදැයි යන්න පිළිබඳ ව ලැබුණු පැමිණිල්ලක් හෝ යම් තොරතුරු මත, මේ පනත යටතේ අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් හඳුනා ගැනීම, ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සහතික කිරීම උදෙසා, කරන ලදැයි කියන කඩ කිරීම පිළිබඳ ව විමර්ශනය කර ඒ සම්බන්ධයෙන් සුදුසු නිවැරදි කිරීමේ ක්‍රියා මාර්ග ගැනීමට අදාළ අධිකාරීන්ගෙන් ඉල්ලා සිටීම.
5. අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට අවශ්‍ය ප්‍රතිකාර, හානිපූරණය, ප්‍රතිෂ්ඨාපනය සහ පුනරුත්ථාපන පියවර ගැනීම ඇතුළු ව අවශ්‍ය සහාය සැපයීම.
6. අපරාධයක වින්දිතයන් හට මේ පනතේ 29 වන වගන්තිය මගින් පිහිටුවන ලද අපරාධයක වින්දිතයන්ගේ හා සාක්ෂිකරුවන්ගේ අරමුදලෙන් වන්දි ප්‍රදානය කිරීම සඳහා යෝජනා ක්‍රමයක් සකස් කර එය පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම.
7. මේ පනත මඟින් සලසා ඇති අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් පිළිබඳ ව මහජනයා දැනුවත් කිරීම.
8. විශේෂයෙන් ම අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට -
    i. ඵලදායී ආරක්ෂාව
    ii. අවශ්‍ය ප්‍රතිකාර, පුනරුත්ථාපනය සහ උපදේශනය
    සහ
    iii. වෙනත් සුදුසු සහායයන් සැපයීම ඇතුළු ව,

    අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට මෙම පනතින් සලසා ඇති අයිතිවාසිකම් සහ හිමිකම්වලට බලාත්මක භාවයක් ලබා දීම පිණිස යොදා ගත යුතු, පිළිගත යුතු හෝ ක්‍රියාත්මක කළ යුතු සුදුසු සහ විශේෂිත පියවර පිළිබඳ සාමාන්‍යයෙන් හෝ එක් එක් අවස්ථාවන් වෙන් වෙන් ව සලකා බැලීමේ පදනම මත, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට සහ වෙනත් යම් රජයේ දෙපාර්තමේන්තුවකට, ව්‍යවස්ථාපිත ආයතනයකට සහ රජයේ නිලධරයන්ට, උපදෙස් දීම සහ නිර්දේශ කිරීම.

9. විවිධ අධිකාරීන් විසින් පිළිගත් සහ අනුගමනය කරන, දැනට පවතින ප්‍රතිපත්ති, නීති සහ ක්‍රියාමාර්ග සහ ක්‍රියාපටිපාටි අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීමට අදාළව පිළිගත් සම්මතයන්ට සහ යහපත් පරිචයන්ට අනුකූල බව තහවුරු කර ගැනීම උදෙසා

ඒවා සමාලෝචනය කිරීම හා එම සමාලෝචනයන් පදනම් කර ගනිමින් සුදුසු ප්‍රතිපත්ති, නීති සහ ක්‍රියා මාර්ග පිළිගැනීම, සංශෝධනය කිරීම සහ යොදා ගැනීම පිළිබඳ ව නිර්දේශ කිරීම.

10. යම් අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් හෝ වෙන යම් තැනැත්තකුගේ ඉල්ලීම මත, සමකාලීන හෝ ආසන්න සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් මගින් සාක්ෂි ලබා ගැනීමේ පිළිගත් ප්‍රතිමාන සහ යහපත් පරිචයන් පිළිබඳ ව තොරතුරු ලබා දීමට සැලැස්වීම.

11. අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ආගම, භාෂාව, සංස්කෘතික විශ්වාසයන් සහ පුරුදු, ජන වාර්ගික හෝ සමාජ ප්‍රභවයන් හෝ ආබාධිත බව හෝ වෙනත් යම් හේතු නිසා සිදු විය හැකි හානිවල ප්‍රතිඵලයන් ලෙස අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට පැන නගින අවශ්‍යතා සහ සුවිශේෂ කණ්ඩායම්වලට අයත් අපරාධයක වින්දිතයන්ට පැන නගින විශේෂ අවශ්‍යතා මත, ශ්‍රී ලංකා පොලිසියේ නිලධරයන්, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධරයන්, රජයේ වෛද්‍ය නිලධරයන්, පරිවාස හා සමාජ සේවාවලට සම්බන්ධ රජයේ නිලධරයන් ඇතුළුව, නීතිය බලාත්මක කිරීමට සම්බන්ධ රජයේ නිලධරයන් සංවේදීකරණය කිරීමට පියවර ගැනීම.

12. ශ්‍රී ලංකා පොලිසියේ නිලධරයන්, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධරයන්, රජයේ වෛද්‍ය නිලධරයන් සහ රජයේ සමාජ සේවා ආයතනවල නිලධරයන් ඇතුළු ව, නීතිය බලාත්මක කිරීමට අදාළ අධිකරණ, කොමිෂන් සභා, වෙනත් යම් විනිශ්චය සභා, රජයේ නිලධරයන් සහ ව්‍යවස්ථාපිත ආයතනවල සේවා නියුක්තිකයන් විසින්, අපරාධයක වින්දිතයන්ගේ අයිතිවාසිකම් සහ සාක්ෂිකරුවන්ගේ හිමිකම් ආරක්ෂා කිරීමට අදාළ පාලන සංග්‍රහයන් සහ පිළිගත් ප්‍රතිමාන සහ යහපත් පරිචයන් පිළිපැදීම සහ අදාළ කර ගැනීම ප්‍රවර්ධනය කිරීම සහ නිර්දේශ කිරීම.

13. (i) අපරාධ සිදුවීම අඩුකළ හැකි;

(ii) නිශ්චිත අපරාධවලින් වින්දිතයන් හට සිදුවන බලපෑම අවම කළ හැකි හෝ වැළැක්විය හැකි;

(iii) වින්දිතයන්ට ඵලදායි ලෙස ප්‍රතිකාර කළ හැකි, පුනරුත්ථාපනය කළ හැකි, උපදේශනය කළ හැකි, සහාය දිය හැකි, වන්දි ගෙවිය හැකි සහ ආරක්ෂා කළ හැකි;

(iv) නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් ඉදිරිපිට හෝ අධිකරණයක් ඉදිරිපිට සහ වෙනත් කොමිෂන් සභාවක් ඉදිරිපිට සහ වෙනත් කොමිශන් සභාවක් ඉදිරිපිට සහ වෙනත් විනිශ්චය සභාවක් ඉදිරිපිට වූ නඩු කටයුත්තක දී, බියෙන් තොරව සාක්ෂිකරුවන් හට ප්‍රකාශයන් කිරීමට හෝ සාක්ෂි දීමට උපකාරී වන පරිසරයක් නිර්මාණය කළ හැකි;

(v) අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහාය සහ ආරක්ෂාව සැලසිය හැකි,

ක්‍රම සහ විධි පිළිබඳව පර්යේෂණ පැවැත්වීම හෝ එසේ පැවැත්වීම ප්‍රවර්ධනය කිරීම;

14. අපරාධ සිදුවීම් අඩුකිරීම සඳහා සහ අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහාය සහ ආරක්ෂාව පිළිබඳ පහසුකම් සැලස්වීම සඳහා අදාළ රජයේ ආයතනවලට ඒ ආයතන මගින් තෝරාගනු ලැබිය හැකි සමාජ, සෞඛ්‍ය, අධ්‍යාපනික, ආර්ථික සහ අපරාධ වැළැක්වීමේ ප්‍රතිපත්ති පිළිබඳව නිර්දේශ කිරීම;

15. අපරාධ යුක්ති පද්ධතිය තුළ දඬුවම් නියම කිරීමට විකල්පයක් වශයෙන් අපරාධයක වින්දිතයන් පෙර සිටි තත්ත්වයට ගැනීමේ පියවර වර්ධනය කිරීම, පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නිර්දේශ කිරීම;
16. අපරාධ යුක්ති පරිපාලනය කිරීමේ ක්‍රමයක් ලෙස සහ අපරාධ යුක්ති පද්ධතිය තුළ දඬුවම් නියම කිරීමට විකල්පයක් වශයෙන්, පෙර තිබූ තත්ත්වයට පැමිණවීම සඳහා යුක්ති සහගත පියවර ගැනීම වර්ධනය කිරීම, පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නිර්දේශ කිරීම;
17. අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහාය සැපයීම සඳහා යෝජනා ක්‍රමයක් වැඩිදියුණු කිරීම,යොදාගැනීම සහ ක්‍රියාත්මක කිරීම;
18. අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාසය පිහිටුවීම සහ පවත්වාගෙන යාම සඳහා අදාළ නියමු උපදේශන නිකුත් කිරීම;
19. (i) අධිකාරිය විසින් මේ පනතේ අරමුණුවලට බලාත්මක භාවයක් දී ඇති ආකාරය;

    (ii) අධිකාරියේ කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම; සහ

    (iii) අවශ්‍ය ප්‍රතිපත්තිමය සහ නීතිමය ප්‍රතිසංසකරණ,

    පිළිබඳ වාර්තාවක් වාර්ෂිකව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම;
20. මේ පනතේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය විය හැකි වැඩිදුරටත් වූ යම් කර්තව්‍ය හා කාර්යයයන් ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම.

**පනතේ 11 වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ මෙම ජාතික අධිකාරියේ බලතල හා කාර්යභාරය පහත සඳහන් පරිදි සංක්ෂිප්ත ව දැක්විය හැකි ය.**

- **බලාත්මක කිරීමේ කාර්යභාරය**

  අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් හඳුනා ගැනීම, ගෞරව කිරීම, ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම හා දැනුවත් කිරීම.

- **අර්ධ අධිකරණමය කාර්යභාරය**

  අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් කඩවීම් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීම හා විභාග කිරීම, එම උල්ලංඝනයට අදාළ ව උචිත රාජ්‍ය නිලධාරීන්ට සහ රාජ්‍ය ආයතනවලට නියෝග නිකුත් කිරීම

- **සේවා කාර්යභාරය**

  අපරාධයක වින්දිතයන්ට හා සාක්ෂිකරුවන්ට ආරක්ෂාව සහ සහාය සැලසීම, වන්දි ප්‍රදානය කිරීම

- **නියාමන කාර්භාරය**

  නියමු උපදේශන නිකුත් කිරීම හා අධීක්ෂණය, අපරාධ සිදුවීම අඩු කළ හැකි ක්‍රම හා විධි පිළිබඳ ව පර්යේෂණ පැවැත්වීම හා ප්‍රවර්ධනය කිරීම, අපරාධ වැළැක්වීමේ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් නිර්දේශ නිකුත් කිරීම

# පොලිස් සහායක සහ ආරක්ෂක කොට්ඨාසය

2015 අංක 4 දරන පනත මගින් පිහිටුවන ලද තවත් එක් සුවිශේෂ ඒකකයක් වන්නේ ජාතික අධිකාරියේ උපදේශනය හා මඟ පෙන්වීම මත ශ්‍රී ලංකා පොලිසිය යටතේ පිහිටුවන ලද ''අපරාධයක වින්දිතයන්ගේ හා සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාසය'' ලෙස හැඳින්වෙන විශේෂ පොලිස් ඒකකයයි. පනතේ 19 (2) වගන්තිය යටතේ කළමනාකරණ මණ්ඩලයට නිල බලයෙන් පත් කෙරෙන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාකරන ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයෙකු මෙම කොට්ඨාසය භාර ප්‍රධානියා ලෙස පත් කරනු ලැබ ඇති අතර 2016 නොවැම්බර් මස 03 වන දින සිට මෙහි කටයුතු ආරම්භ කර ඇත.

ජාතික අධිකාරිය මඟින් නිකුත් කරනු ලබන නියමු උපදේශන අනුගමනය කරමින් “කොට්ඨාසය” පවත්වා ගෙන යා යුතු අතර අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට ආරක්ෂාව සැලසීම, ඔවුන්ට හා ඔවුන්ගේ දේපළවලට සිදු කරනු ලබන තර්ජන, හානි පැමිණවීම් සම්බන්ධයෙන් වන පැමිණිල්ලක්, චෝදනාවක් හෝ තොරතුරක් පිළිබඳ ව “කොට්ඨාසය” විසින් ම පොලිස් නිලධරයෙකුගේ සහාය ඇති ව විමර්ශනය කිරීම කොට්ඨාසයේ කාර්ය විය යුතු අතර ඔවුන්ට ආරක්ෂාව සහ සහාය වීම සඳහා අධිකාරිය මඟින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ මත කාර්යක්ෂම පියවර ගැනීමට විධිවිධාන සැලසීමට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු ය.

## අධිකාරියෙහි කළමනාකරණ මණ්ඩලය[1]

පනත ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් පත් කළ සාමාජිකයින් :-

1. සභාපති : - ජනාධිපති නීතිඥ සුහද කේ.ගමලත් මහතා
   විශ්‍රාමික සොලිසිටර් ජනරාල්
   නීතිපති දෙපාර්තමේන්තුව



2. උදයකුමාර අමරසිංහ මහතා
   අපරාධ විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
   ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය



3. වෛද්‍ය අජිත් තෙන්නකෝන් මහතා
   ප්‍රධාන අධිකරණ වෛද්‍ය නිලධාරී



4. වෛද්‍ය නීල් ප්‍රනාන්දු මහතා
   විශේෂඥ මනෝ වෛද්‍ය නිලධාරී



5. නීතිඥ සමන් සේනාධීර මහතා



නිල බලයෙන් පත්වූ සාමාජිකයින්: -

1. ජනාධිපති නීතිඥ සුසන්ත බාලපටබැඳි මහතා
   අතිරේක සොලිසිටර් ජනරාල්
   නීතිපති දෙපාර්තමේන්තුව



2. එල්. එස්. පතිනායක මහතා
   ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති
   අපරාධ, සංවිධානාත්මක අපරාධ, ළමුන් සහ කාන්තා අපයෝජන
   වැළැක්වීමේ කාර්යාංශය, මත්ද්‍රව්‍ය සහ මැතිවරණ පරාසය
   පොලිස් මූලස්ථානය



3. නීතිඥ එච්.ජී.හුසේන් මහතා[2]
   කොමසාරිස්
   මානව හිමිකම් කොමිෂන් සභාව



   නිමල් කරුණාසිරි මහතා[3]
   කොමසාරිස්
   මානව හිමිකම් කොමිෂන් සභාව



[1] 2020 නොවැම්බර් මස සිට පත් කරන ලදී.
[2] 2020 නොවැම්බර් මස සිට දෙසැම්බර් මස දක්වා
[3] 2020 දෙසැම්බර් මස සිට

4. නීතිඥ පියුමන්ති පීරිස් මහත්මිය
   අතිරේක ලේකම් (නීති)
   අධිකරණ අමාත්‍යාංශය



5. එන්. එච්. එම්. ඩබ්ලිව්. එන්. හේරත් කුමාරි මහත්මිය
   අතිරේක ලේකම් (සංවර්ධන)
   කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය

6. එම්. එස්. පී. සූරියප්පෙරුම මහත්මිය
   අතිරේක ලේකම් (නීතිය හා සාමය) (වැඩ බලන)
   ආරක්ෂක අමාත්‍යාංශය

නිරීක්ෂක (භාණ්ඩාගාර නියෝජිත)
එස්. ඒ. සී. කුලතිලක මහත්මිය,
අධ්‍යක්ෂ ජනරාල්, කලමණාකරන විගනණ දෙපර්තුමෙන්තුව,
මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සම්පාදන අමාත්‍යාංශය

## 2020 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින්

1. එස්. ඒ. සී. කුලතිලක මහත්මිය - සභාපති
   අධ්‍යක්ෂ ජනරාල්,
   කලමණාකරන විගනණ දෙපර්තුමෙන්තුව,
   මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සම්පාදන අමාත්‍යාංශය

2. පියුමන්ති පීරිස් මිය - සාමාජික
   අතිරේක ලේකම්
   අධිකරණ අමාත්‍යාංශය

3. එම්. එස්. පී. සූරියප්පෙරුම මහත්මිය - සාමාජික
   අතිරේක ලේකම් (නීතිය හා සාමය) (වැඩ බලන),
   ආරක්ෂක අමාත්‍යාංශය
4. නීතිඥ සමන් සේනාධීර මහතා - සාමාජික

5. සුජීවා පෙරේරා මහත්මිය - නියෝජිත
   ජාතික විගණන කාර්යාලය

චම්පා බාලසූරිය - නිරීක්ෂක
අධිකරණ අමාත්‍යාංශය

# කාර්ය මණ්ඩලය - 2020

- **<u>ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය</u>**

| | | |
|---|---|---|
| 1.අධ්‍යක්ෂ ජනරාල් | - | උදයකුමාර අමරසිංහ මහතා |
| 2. අධ්‍යක්ෂ (නීති හා නීති බලාත්මක කිරීම) | - | එස්. එස්.කේ. කස්තුරිආරච්චි මෙනවිය |
| 3. අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා වැඩසටහන්) | - | අයි. සිරිවර්ධන මහතා |
| 4. අධ්‍යක්ෂ (පාලන හා කළමනාකරණ) | - | ඩබ්.ජී. එන්. ප්‍රනාන්දු මහතා |
| 5. අධ්‍යක්ෂ (මූල්‍ය) | - | ජී.ඩී.ආර්. පෙරේරා මහත්මිය |
| 6. සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) | - | ආර්.ඒ.ඩී. චමිලා දිශානි මහත්මිය |
| 7. සහකාර අධ්‍යක්ෂ (නීති) | - | පී. එන්.යූ. පට්ටිආරච්චි මහත්මිය |
| 8. සහකාර අධ්‍යක්ෂ (පාලන ) | - | ඩබ්. එම්. අජිත් බණ්ඩාර මහතා |
| 9. කළමනාකරණ මණ්ඩල ලේකම් | - | බී.ජී. එම්.එස්.ආර්.ඩබ්. ගුණවර්ධන මහත්මිය |

- ***<u>තෘතීය මට්ටම</u>***

| | | |
|---|---|---|
| 1. නීති නිලධාරි | - | එස්.එස් දික්කුඹුර<br>ටී.එම්.පී.ඩී තෙන්නකෝන් |
| 2. අභ්‍යන්තර විගණන නිලධාරි | - | එම්.පී ජයවර්ධන |
| 3. විමර්ශන නිලධාරී | - | එච්.එම්.එස්.පී හේරත්<br>එච්.එස් .විජේනායක<br>ඩබ්.පී.කේ වික්‍රමසිංහ<br>ටී.ඒ.බී.සී ජයසේකර<br>එල්.සී.කේ ලියනගේ |
| 4. තොරතුරු නිලධාරී | - | එම්.ඒ.එස්.ටී මුණසිංහ |
| 5. භාෂා පරිවර්තක | - | ටී.ජේ ගුරුගමගේ |

- **<u>ද්විතීය කාර්ය මණ්ඩලය</u>**

**කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) නිලධාරීන් - 08**

1.සහන් හර්ෂණ අතුකෝරල මහතා

2. එස්.එන්.එච්. නදීෂා මධුමාලි නානායක්කාර මහත්මිය

3. පී.ඒ. දිලිනි දර්ශිකා පෙරේරා මෙනෙවිය

4. එම්.පී. සචිත්‍රා දුලාශනී ගුණසේකර මහත්මිය

5. අයි.ඒ. හර්ෂණී ඉලේපෙරුම මෙනෙවිය

6.දර්ශන් රජීව් ජයමණි මහතා

- **<u>ප්‍රාථමික කාර්ය මණ්ඩලය</u>**

**රියදුරු**

**රියදුරුන් සංඛ්‍යාව - 06**

1. යූ.ඩබ්. විමංග පැතුම් මහතා
2. ඩී.එම්. සම්පත් නිශාන්ත බණ්ඩාර මහතා
3. ඒ. ප්‍රභාත් නිශාන්ත මහතා
4. එස්.බී. භාග්‍යා ප්‍රදීප් මදුසංක මහතා
5. කේ. කසුන් මදුශාන් විමුක්ති මහතා
6. එස්.ගාමිණී විජේකුමාර මහතා

**කාර්යාල කාර්ය සහායකවරුන්**

**කාර්යාල කාර්ය සහායකවරුන් - 05**

1 .ඩබ්. නදීශානී ප්‍රනාන්දු මෙනෙවිය

2. ජේ.ජී. චාමලී මල්කාන්ති විජේවික්‍රම මහත්මිය

3. ඩබ්.එම්. විමල බුද්ධික මහතා

4. ඒ.ඒ. ප්‍රදීප් කුමාර පෙරේරා මහතා

5. කසුන් මධුසංක යකුපිටිය මහතා


**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය**

**කාර්ය මණ්ඩල සාරාංශය -2020/12/31**

**වගුව 01**

| වර්ගය | වැටුප් කේතය | ක.සේ.දෙ. අනුමත කාර්ය මණ්ඩලය | දැනට පවතින කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|---|
| ***ජ්‍යෙෂ්ඨ මට්ටම*** | | | | |
| අධ්‍යක්ෂ ජනරාල් (වැඩ බලන) | HM 2-3 | 1 | 1 | 0 |
| අධ්‍යක්ෂ | HM 1-3 | 6 | 4 | 2 |
| සහකාර අධ්‍යක්ෂ | MM 1-3 | 3 | 3 | 0 |
| කළමනාකරණ මණ්ඩල ලේකම් | MM 1-3 | 1 | 1 | 0 |
| ***තෘතීය මට්ටම*** | | | | |
| නීති නිලධාරී | JM 1-1 | 3 | 2 | 1 |
| අභ්‍යන්තර විගණන නිලධාරී | JM 1-1 | 1 | 1 | 0 |
| විමර්ශන නිලධාරී | MA 4 | 6 | 5 | 1 |
| රැකවරණ නිලධාරී | MA 4 | 10 | 0 | 10 |
| සන්නිවේදන නිලධාරී | MA 4 | 1 | 0 | 1 |
| තොරතුරු නිලධාරී | MA 4 | 1 | 1 | 0 |
| භාෂා පරිවර්තක | MA 4 | 1 | 1 | 0 |
| ***ද්විතීය මට්ටම*** | | | | |
| කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | MA 1-1 | 10 | 6 | 4 |
| ***ප්‍රාථමික මට්ටම*** | | | | |
| රියදුරු | PL 3 | 6 | 6 | 0 |
| කාර්යාල කාර්ය සහායක | PL 1 | 6 | 5 | 1 |
| එකතුව | | **56** | **36** | **20** |

**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත සේවක සංඛ්‍යාව**



# කාර්ය සාධනය

<u>කාර්ය සාධන වාර්තාව- 2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා</u>

**සැලකිය යුතුයි:** රට තුළ පැවැති කොවිඩ් - 19 වසංගත තත්වයත් සමග 2020 වර්ෂයේදී ක්‍රියාකාරි සැලැස්ම සහ ප්‍රසම්පාදන සැලැස්මට අනුව පුරෝකථනය කරන ලද කාර්යයන් ඒ ඒ කාලයන් තුළ දී සිදු කිරීමට නොහැකි විය. එමෙන්ම ජාතික අධිකාරිය සඳහා 2019 නොවැම්බර් මස සිට 2020 නොවැම්බර් මස වනතුරු කළමණාකරන මණ්ඩලයක් පත්කර නොමැති විම කාර්යය සාධනයට බලපැවේය.


| | |
|---|---|
| පාලන හා කළමනාකරණ අංශය | 28-31 |
| නීති හා නීති බලාත්මක කිරීමේ අංශය | 32-37 |
| රැකවරණ අංශය | 38-40 |
| ප්‍රතිපත්ති හා වැඩසටහන් අංශය | 41-44 |
| මූල්‍ය අංශය | 45-46 |

# පාලන හා කළමනාකරණ අංශය

**01.** **දේශිය / විදේශීය පුහුණු**

අදාළ කාලය තුළ විදේශය පුහුණු වැඩසටහන් සඳහා කිසිඳු නිලධාරියෙක් සහභාගී නොවුණු අතර දේශීය පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීමට අවස්ථාව ලැබිණි. එය පහතින් දක්වා ඇත.

| පුහුණු වැඩසටහනේ නම | පවත්වන ලද ආයතනය | සහභාගී වූ නිලධාරීන් | කාල සීමාව |
|---|---|---|---|
| අධීක්ෂණ සංවර්ධන වැඩසටහන (Supervisor Development Programme) | වරලත් පිරිස් කළමනාකරණ ආයතනය (CIPM) | සුරේණි දික්කුඹුර<br>ප්‍රභාෂී දිනෙල්කා | 2020.01.21, 22, 23 |
| ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම (How to Prepare Action Plan & Procurement plan) | නිපුණතා සංවර්ධන අරමුදල (SDFL) | ඩබ්. එම්. ඒ. බණ්ඩාර<br>පී. එන්. යූ. පට්ටිආරච්චි | 2020.02.24 සිට 26 |
| උත්සව කළමනාකරණය පිළිබඳ වැඩමුළුව (Workshop on Event Management) | නිපුණතා සංවර්ධන අරමුදල (SDFL) | තත්මිණී ජයාංගනා<br>දර්ශන් රජීව් ජයමණි | 2020.09.17, 18 |
| කැබිනට් පත්‍රිකා පිළියෙළ කිරීම (Preparation of Cabinet Paper) | නිපුණතා සංවර්ධන අරමුදල (SDFL) | ඩබ්. එම්. ඒ. බණ්ඩාර<br>චමිලා දිශානී | 2020.09.21 |
| නායකත්ව පුහුණු වැඩසටහන (Leadership Development Programme) | නිපුණතා සංවර්ධන අරමුදල (SDFL) | තත්මිණී ජයාංගනා | 2020.09.28, 29 |
| ගබඩා පාලනය සහ ගබඩා කළමනාකරණය (Inventory Control And Inventory Management) | නිපුණතා සංවර්ධන අරමුදල (SDFL) | හර්ශණී ඉලේපෙරුම<br>නදීශා මධුමාලී | 2020.09.24, 25 |

2021 වර්ෂයට අදාළ කාර්යමණ්ඩල පුහුණු අවශ්‍යතා හඳුනාගෙන මේවන විට පුහුණු සැලැස්ම සකස් කරමින් පවතියි. බඳවා ගැනීමට අපේක්ෂිත නව කාර්යමණ්ඩලය සඳහා අනුස්ථාපන වැඩසටහන් හා පුහුණු වැඩටහන්ද සකස් කර ඇත.

**02.** **ප්‍රසම්පාදන (ප්‍රසම්පාදන සැලැස්මට අනුව)**

රට තුළ පැවැති තත්වය මත සැළසුම් කරන ලද ආකාරයට අපේක්ෂිත ප්‍රසම්පාදනයන් සිදු කිරීමට නොහැකි වූ අතර 2020 වර්ෂය තුළ දී සිදු කෙරුණු කාර්යයන් පහත දැක්වේ.

- ✓ ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය හරහා සාක්ෂි දීමට අදාළ ප්‍රසම්පාදනයන් මේවන විටත් අවසන් කර ඇත.
- ✓ ජාල කළමනාකරණ පද්ධති (Server) සකස් කිරීම අවසන් කර ඇත.


- ✓ කාර්යාලීය ලී / වානේ භාණ්ඩ මිළ දී ගැනීම සිදු කර ඇත.
- ✓ කළමණාකරණ මණ්ඩල රැස්වීම් ශාලාව ආශ්‍රිත ප්‍රදේශය පාර්ටීෂන් කර වෙන් කිරීම් සිදු කිරීම.
- ✓ ආයතනික වෙබ් අඩවිය නිර්මාණය කිරීමට අදාළව මිළ ගණන් කැඳවා සේවා සපයන ආයතන වෙත කොන්ත්‍රාත්තුව බාර දී ඇත.
- ✓ අනෙකුත් ප්‍රසම්පාදන බොහොමයක වැඩකටයුතු මේවන විටත් කෙරෙමින් පවතී.

**03. මානව සම්පත් කළමනාරණය**

- ✓ කළමනාකරණ සේවා දෙපාර්තමෙන්තුව මගින් නීති නිලධාරී එක් තනතුරක් අනුමත කරවා ගන්නා ලදී.
- ✓ මේවන වන විටත් අනුමත වී ඇති අධ්‍යක්ෂ (රැකවරණ) සහ අධ්‍යක්ෂ (සහාය සේවා) තනතුරු දෙකට අදාළ බඳවා ගැනීමේ පටිපාටි කළමනාකරණ සේවා දාපාර්තමේන්තුව මගින් අනුමත කරවා ගන්නා ලදී.
- ✓ පවතින පුරප්පාඩු පිරවීම සඳහා 2020.12.06 දින පුවත්පත් දැන්වීම් පල කරන ලද අතර ඒ සඳහා ලැබුණු අයඳුම්පත් මේවන විට Short List කර අවසන් අදියරේ පවතී.
- ✓ ජාතික අධිකාරිය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වා දීම (මානව සම්පත් තොරතුරු පද්ධතිය)

අධිකාරියේ 2020.12.31 වන දින වන විට අධිකාරිය සඳහා බඳවා ගෙන ඇති නිලධාරීන් පිළිබඳව විස්තර පහත පරිදි වේ.

| සේවා වර්ගය | ක.සේ.දෙ. අනුමත කාර්ය මණ්ඩලය | දැනට පවතින කාර්ය මණ්ඩලය |
|---|---|---|
| <u>ජ්‍යෙෂ්ඨ මට්ටම</u><br>අධ්‍යක්ෂ ජනරාල්<br>අධ්‍යක්ෂ<br>සහකාර අධ්‍යක්ෂ<br>කළමනාකරණ මණ්ඩල ලේකම් | 11 | 9 |
| <u>තෘතීය මට්ටම</u><br>නීති නිලධාරි<br>අභ්‍යන්තර විගණන නිලධාරි<br>විමර්ශන නිලධාරි<br>රැකවරණ නිලධාරි<br>සන්නිවේදන නිලධාරි<br>තොරතුරු නිලධාරි<br>භාෂා පරිවර්තක | 23 | 10 |
| <u>ද්විතීය මට්ටම</u><br>කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | 10 | 6 |
| <u>ප්‍රාථමික මට්ටම</u><br>රියදුරු<br>කාර්යාල කාර්යය සහායක | 12 | 11 |
| එකතුව | **56** | **36** |




**කළමනාකරණ මණ්ඩල සහ අනෙකුත් රැස්වීම්**

- 2020 නොවැම්බර් මස කලමණාකරන මණ්ඩලය පත්වූ බැවින් 2020 වර්ෂය තුල කළමනාකරණ මණ්ඩල රැස්වීම් 2 ක් පමණක් පැවැත්වීමට හැකිවිය.
- අධිකාරියේ අධ්‍යක්ෂකවරුන්ගේ සහභාගිත්වයෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ රැස්වීම් 10ක් පැවැත්විය.

# නීති හා නීති බලාත්මක කිරීමේ අංශය

- 2020 වසරේ ජනවාරි මාසයේ 01 සිට 2020 දෙසැම්බර් 31 දක්වා අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියට මහජනතාව හා ආයතන විසින් යොමු කරන ලද පැමිණිලි ගණන 157 ක් වේ. 2019 වසරේ අවසානය තෙක් අධිකාරියට ලැබුණු පැමිණිලි අතරින් 2020 ආරම්භය වන විටත් අවසන් වී නොතිබුණු පැමිණිලි ගණන 221 කි. ඒ අනුව 2020 වසරේ දී අධිකාරිය විසින් විවිධ පියවර ගන්නා ලද පැමිණිලි ගණන 368 කි. කෙසේ වුවද 2020 වසරේ ජනවාරි මස 01 දින සිට 2020 දෙසැම්බර් 31 දක්වා ලැබුනු පැමිණිලි හා ඉල්ලීම් සම්බන්ධයෙන් අධිකාරිය විසින් ගන්නා ලද පියවර හා ඒ අනුව ඉහත සියලුම ඉල්ලීම්වලට අදාළ වර්තමාන තත්වය පහත පරිදි වේ.
  - ✓ 2020 වසර තුළ අධිකාරියට ලැබී ඇති මුලු පැමිණිලි ගණන - 157
  - ✓ අධිකාරියේ නීති අංශය විසින් විමර්ශනය කළ යුතුව පැවති පැමිණිලි සංඛ්‍යාව - 54
  - ✓ නීති අංශය විසින් වරද විමර්ශනය සඳහා පොලිස් කොට්ඨාසයට හෝ වෙනත් පොලිස් ස්ථානයකට යවන ලද පැමිණිලි - 34
  - ✓ නීති අංශය විසින් අධිකාරියේ රැකවරණ අංශයට යොමු කල ලිපිගොනු සංඛ්‍යාව - 53 (මෙම පැමිණිලි අතරින් එක් පැමිණිල්ලක් රැකවරණ අංශයට යවන ලද්දේ 2021 වසර ආරම්භවීමෙන් ඉක්බිතිවය.)
  - ✓ අධිකාරියෙන් විවිධ සහාය ලබා ගැනීම සඳහා ඉල්ලුම් කරන ලදුව සහාය ලබා දෙමින් පවතින සහ සහාය ලබාදී අවසන් කල පැමිණිලි සංඛ්‍යාව - 11
  - ✓ අධිකාරියේ විෂය පථයට අයත් නොවන පැමිණිලි සංඛ්‍යාව - 48
  - ✓ මෙම පැමිණිලි අතරින් නීති අංශය විසින් 2020 වසර තුළ දී සම්පූර්ණයෙන් ම අවසන් කරන ලද පැමිණිලි සංඛ්‍යාව - 44
  - ✓ කෙසේ වුවද උක්ත පැමිණිලි 157 තුළ අධිකාරියේ විෂය පථයට ඇතුළත් වන ඉල්ලීම් ගණන 152 ක් සහ අධිකාරියේ විෂය පථයට අදාළ නොවන ඉල්ලීම් 48 ක් පවතින අතර ඒවායේ ස්වාභාවය අනුව කරන ලද වර්ගීකරණය පහත දක්වා ඇත. කෙසේ වුවද උක්ත පැමිණිලිවල සඳහන් ඉල්ලීම් අනුව ඒවා වර්ගීකරණය කල විට අධිකාරිය විසින් ගතයුතු පියවර සංඛ්‍යාව 200 ක් වේ. (53+34+11+54+48).

| ඉල්ලීමේ ස්වභාවය | ඉල්ලීම් ගණන |
|---|---|
| අයිතිවාසිකම් හා හිමිකම් උල්ලංඝනය කිරීම පිළිබඳ පැමිණිලි | 38 |
| 8,9 වගන්තිය යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන පැමිණිලි | 5 |
| ආරක්ෂාව අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 20 |
| සහාය අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 10 |
| අයිතිවාසිකම් හා හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ පැමිණිලි සහ 8,9 වගන්තිය යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන පැමිණිලි | 3 |

| | |
|---|---|
| 8,9 වගන්තිය යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන පැමිණිලි සහ ආරක්ෂාව අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 20 |
| අයිතිවාසිකම් හා හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ පැමිණිලි, ආරක්ෂාව අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් සහ සහාය අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 5 |
| අයිතිවාසිකම් සහ හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ පැමිණිලි, 8,9 වගන්තිය යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන පැමිණිලි සහ සහාය අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 7 |
| අයිතිවාසිකම් සහ හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ පැමිණිලි, 8,9 වගන්තිය යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන පැමිණිලි, සහාය අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් සහ ආරක්ෂාව අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 1 |
| වෙනත් ඉල්ලීම් | 48 |
| **එකතුව** | **157** |

- 2020 වසරේ අධිකාරියට ලැබුණු පැමිණිලි අතරින් සම්පූර්ණයෙන්ම කටයුතු අවසන් කර ඇති පැමිණිලි ගණන 44 ක් වන නමුත් 2020 වසර අවසන් වන විට අධිකාරිය විසින් සම්පූර්ණයෙන්ම අවසන් කරන ලද මුලු පැමිණිලි සංඛ්‍යාව පහත පරිදි වේ

| **වර්ෂය** | **ලද පැමිණිලි සංඛ්‍යාව** | **නීති අංශය විසින් අවසන් කරන ලද පැමිණිලි සංඛ්‍යාව** |
|---|---|---|
| 2016 | 12 | 8 |
| 2017 | 49 | 38 |
| 2018 | 86 | 51 |
| 2019 | 252 | 125 |
| 2020 | 157 | 44 |
| | 556 | 266 |

- එසේ වුවද, අනෙක් පැමිණිලිවල සඳහන් සමහර ඉල්ලීම් ද මේ වන විට ඉටුකර අවසන්ව ඇත. එම පැමිණිලිවලට අදාළ වෙනත් ඉල්ලීම් සම්බන්ධ කටයුතු තවදුරටත් සිදු කරගෙන යනු ලැබේ. ඒ අතර අධිකරණය ඉදිරියේ වින්දිත බලපෑම් ප්‍රකාශ ගොනු කිරීම මගින් අධිකරණ මාර්ගයෙන් වින්දිතයන්ට හානි පූරණ වන්දි ලබා දීමට සහාය වීම, අධිකරණයේ විභාග වන නඩුවල සාක්ෂි සමකාලීන ශ්‍රව්‍ය දෘෂ්‍ය සම්බන්ධක මගින් දුරස්ථ ස්ථානවල සිට මෙහෙවීමට සහාය වීම සහ අධිකාරියට විරුද්ධව විවිධ තැනැත්තන් විසින් පවරා ඇති නඩු කටයුතුවල දී අවශ්‍ය නෛතික පියවර ගැනීම ද ඇතුළත් වේ.

## 2020 වසර තුළදී විමර්ශනය අවසන් කරන ලද පැමිණිලිවල සාරාංශය

### අයිතිවාසිකම් හා හිමිකම් උල්ලංඝනය කිරීම පිළිබඳ පැමිණිලි

| අනු අංකය | යොමු අංකය | අවසන් කිරීමට හේතුව |
|---|---|---|
| 01 | VWPA/L&LE/RE/07/20 | තමාගේ පැමිණිල්ල විභාග නොකළ බවට පොලිස් ස්ථානයකට එරෙහිව ඉදිරිපත් වූ පැමිණිල්ලකි. පොලිස් ස්ථානය මුල් පැමිණිල්ල මගින් සමථ මණ්ඩලයට යොමු කිරීමෙන් අනතුරුව සමථ කර ඇති බැවින් පොලිස් ස්ථානයට එරෙහි පැමිණිල්ල වසා දමන ලදි. |
| 02 | VWPA/L&LE/RE/15/20 | පනතේ විෂය පථයට යටත් නොවන බව පසුව අනාවරණය විය. |
| 03 | VWPA/L&LE/RE/22/20 | කිසිදු තර්ජනයක් අනාවරණය වී නොමැත. |
| 04 | VWPA/L&LE/RE/23/20 | සැකකරු අත්අඩංගුවට ගෙන ඇති අතර නඩුවක් ගොනු කර ඇත. |
| 05 | VWPA/L&LE/RE/34/20 | විත්තිකරු අත්අඩංගුවට ගෙන ඇති අතර, B / 2304/ 2020 යටතේ කුරුණෑගල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් ගොනු කර ඇත |
| 06 | VWPA/L&LE/RE/37/20 | B 523/ 10 යටතේ හඟුරන්කෙත පොලීසිය විසින් වලපනේ මහේස්ත්‍රාත් අධිකරණයෙහි නඩුවක් ගොනු කර ඇත. |
| 07 | VWPA/L&LE/RE/16/20 | හසලක පොලිසියේ වාර්තාව අනුව පැමිණිලිකරු උන්මත්තකභාවයෙන් යුතු පුද්ගලයකු වන අතර ඔහු සතුව ස්ථිර ලිපිනයක් නොමැත. |

### ආරක්ෂාව අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම්

| අනු අංකය | යොමු අංකය | අවසන් කිරීමට හේතුව |
|---|---|---|
| 08 | VWPA/L&LE/P/21/20 | පැමිණිලිකරුගේ ඉල්ලීම මත අවසන් කරන ලදී |

### වැරදි සම්බන්ධයෙන් පමණක් වන පැමිණිලි

| අනු අංකය | යොමු අංකය | අවසන් කිරීමට හේතුව |
|---|---|---|
| 09 | VWPA/L&LE/O /09/20 | පොලිස් කොට්ඨාසයේ වාර්තාව අනුව කිසිදු තර්ජනයක් පවතිනබවට අනාවරණය වී නැත. |
| 10 | VWPA/L&LE/O /39/20 | අධිකාරියට පැමිණිලිකරු සම්බන්ධ කර ගැනීමට නොහැකි විය. |

### වැරදි සම්බන්ධයෙන් වන පැමිණිලි ,අයිතිවාසිකම් හා හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ පැමිණිලි සහය සහ ආරක්ෂාව අපේක්ෂාවෙන් සිදු කරන ලද ඉල්ලීම්

| අනු අංකය | යොමු අංකය | අවසන් කිරීමට හේතුව |
|---|---|---|
| 11 | VWPA/L&LE/O/01/20<br>VWPA/L&LE/P/02/20<br>VWPA/L&LE/RE/04/20 | ආරක්ෂාව සපයා ඇත. වරදක් අනාවරණය වී නැත. අයිතිවාසිකමක් කඩ වී නැත. |
| 12 | VWPA/L&LE/O /10/20<br>VWPA/L&LE/P/16/20<br>VWPA/L&LE/RE/12/20 | නාරම්මල පොලීසිය විසින් 28293/17 යටතේ නාරම්මල මහේස්ත්‍රාත් අධිකරණයෙහි නඩුවක් ගොනු කර ඇත. |

වැරදි සම්බන්ධයෙන් වන පැමිණිලි , සහය සහ ආරක්ෂාව අපේක්ෂාවෙන් සිදු කරන ලද ඉල්ලීම්

| අනු අංකය | යොමු අංකය | අවසන් කිරීමට හේතුව |
|---|---|---|
| 13 | VWPA/L&LE/O /03/20<br>VWPA/L&LE/P/04/20<br>VWPA/L&LE/A/04/20 | නාරම්මල පොලිසියේ වාර්තාව අනුව, 2015 අංක 4 දරන පනත යටතේ කිසිදු වරදක් සිදු කර නොමැත. |


වෙනත් ඉල්ලීම

| අනු අංකය | යොමු අංකය | අවසන් කිරීමට හේතුව |
|---|---|---|
| 14 | VWPA/L&LE/O.COM/01/20 | ගම්පහ අධිකරණයේ නඩුව විභාග වන බැවින් අධිකාරියට මැදිහත් විය නොහැකි ය. |
| 15 | VWPA/L&LE/O.COM/04/20 | ඉල්ලීම පනතේ විෂය පථයට අයත් නොවේ. |
| 16 | VWPA/L&LE/O.COM/03/20 | ඉල්ලීම පනතේ විෂය පථයට අයත් නොවේ. |
| 17 | VWPA/L&LE/O.COM/06/20 | ඉල්ලීම පනතේ විෂය පථයට අයත් නොවේ. |
| 18 | VWPA/L&LE/O.COM/08/20 | ඉල්ලීම පනතේ විෂය පථයට අයත් නොවේ. |
| 19 | VWPA/L&LE/O.COM/10/20 | ඉල්ලීම පනතේ විෂය පථයට අයත් නොවේ. |
| 20 | VWPA/L&LE/O.COM/12/20 | ඉල්ලීම පනතේ විෂය පථයට අයත් නොවේ. |
| 21 | VWPA/L&LE/O.COM/13/20 | අවවාද ලබා දී ඇත |
| 22 | VWPA/L&LE/O.COM/16/20 | ඉල්ලීම පනතේ විෂය පථයට අයත් නොවේ. |
| 23 | VWPA/L&LE/O.COM/17/20 | ඉල්ලීම පනතේ විෂය පථයට අයත් නොවේ. |
| 24 | VWPA/L&LE/O.COM/15/20 | ඉල්ලීම පනතේ විෂය පථයට අයත් නොවේ. |
| 25 | VWPA/L&LE/O.COM/14/20 | 2015 අංක 4 දරන පනත යටතේ වැඩිදුර ක්‍රියාමාර්ග ගත නොහැකි වේ. |
| 26 | VWPA/L&LE/O.COM/18/20 | පැමිණිලිකරු විත්තිකරුවකු වන බැවින් අධිකාරියට පොලිස් විමර්ශන සඳහා මැදිහත් විය නොහැකි වේ.පැමිණිල්ල විමර්ශනයේදී සිය විත්ති වාචකය ඉදිරිපත් කළ හැකි ය. |
| 27 | VWPA/L&LE/O.COM/19/20 | ඉල්ලීම පනතේ විෂය පථයට අයත් නොවේ. |
| 28 | VWPA/L&LE/O.COM/20/20 | ඉල්ලීම පනතේ විෂය පථයට අයත් නොවේ. |
| 29 | VWPA/L&LE/O.COM/21/20 | ඉල්ලීම පනතේ විෂය පථයට අයත් නොවේ. |
| 30 | VWPA/L&LE/O.COM/22/20 | දැනට විභාගවෙමින් පවතින නඩුවකි. මැදිහත් විය නොහැකි ය. |
| 31 | VWPA/L&LE/O.COM/23/20 | ඉල්ලීම පනතේ විෂය පථයට අයත් නොවේ. |
| 32 | VWPA/L&LE/O.COM/26/20 | ඉල්ලීම පනතේ විෂය පථයට අයත් නොවේ. |
| 33 | VWPA/L&LE/O.COM/30/20 | ඉල්ලීම පනතේ විෂය පථයට අයත් නොවේ. |
| 34 | VWPA/L&LE/O.COM/31/20 | ඉල්ලීම පනතේ විෂය පථයට අයත් නොවේ. |
| 35 | VWPA/L&LE/O.COM/34/20 | ඉල්ලීම පනතේ විෂය පථයට අයත් නොවේ. |
| 36 | VWPA/L&LE/O.COM/35/20 | ඉල්ලීම පනතේ විෂය පථයට අයත් නොවේ. |
| 37 | VWPA/L&LE/O.COM/36/20 | ඉල්ලීම පනතේ විෂය පථයට අයත් නොවේ. |
| 38 | VWPA/L&LE/O.COM/11/20 | පොලීසිය විසින් අයිතිවාසිකම් උල්ලංඝණය කර නොමැති අතර පොලීසිය විසින් සිදු කර ඇත්තේ සිතාසි ලබාදීමට කටයුතු කිරීමයි. |
| 39 | VWPA/L&LE/O.COM/28/20 | ඉල්ලීම අප පනතේ විෂය පථයට අයත් නොවේ. |
| 40 | VWPA/L&LE/O.COM/29/20 | ඉල්ලීම පනතේ විෂය පථයට අයත් නොවේ. |
| 41 | VWPA/L&LE/O.COM/33/20 | ඉල්ලීම පනතේ විෂය පථයට අයත් නොවේ. |

| අනු අංකය | යොමු අංකය | අවසන් කිරීමට හේතුව |
|---|---|---|
| 42 | VWPA/L&LE/O.COM/38/20 | මෙම පැමිණිල්ල .ප්‍රාථමික නඩු විධාන සංග්‍රහය පනතේ 66 වන වගන්තිය යටතේ කටයුතු කළ යුතු පැමිණිල්ලක් වන බැවින් අධිකාරියට මිට මැදිහත්විය නොහැක. |
| 43 | VWPA/L&LE/O.COM/41/20 | 2015 අංක 4 දරන පනතේ විෂය පථයට අයත් නොවන පැමිණිල්ලකි. |

- 2020 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා අධිකාරිය ක්ෂණිකව සම්බන්ධ කරගත හැකි දුරකතන අංකය වන 1985 සඳහා ලැබුණු ඇමතුම් වල තොරතුරු පහත පරිදි වේ.

| මාසය | ඇමතුම් සංඛ්‍යාව |
|---|---|
| ජනවාරි | 119 |
| පෙබරවාරි | 105 |
| මාර්තු | 40 |
| අප්‍රේල් | 0 |
| මැයි | 0 |
| ජූනි | 27 |
| ජූලි | 145 |
| අගෝස්තු | 159 |
| සැප්තැම්බර් | 184 |
| ඔක්තොම්බර් | 30 |
| නොවැම්බර් | 3 |
| දෙසැම්බර් | 2 |
| **එකතුව** | **814** |



# එකවරණ අංශය

- 2020 වසරේ ජනවාරි මස 01 වන දින සිට 2020 දෙසැම්බර් මස 31 දක්වා අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ නීති හා නීති බලාත්මක කිරීමේ අංශය මගින් රැකවරණ අංශය වෙත යොමු කරන ලද ඉල්ලීම් සහ පැමිණිලි ගණන 52 ක් වේ. එමෙන්ම අධිකාරිය වෙත 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ලැබී ඇති ආරක්ෂාව සම්බන්ධයෙන් වන ඉල්ලීම් අතුරින් අවසන් නොමැති පැමිණිලි වලට අදාලවද ආරක්ෂණ අංශය විසින් 2020 වර්ෂයේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. එකී පැමිණිලි සම්බන්ධයෙන් රැකවරණ අංශය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

| වර්ෂය | පැමිණිලි සංඛ්‍යාව | විමර්ශනය වෙමින් පවතින පැමිණිලි | ආරක්ෂාව ලබා දෙමින් පවතින සහ ආරක්ෂාව ලබා දෙන ලද පැමිණිලි | | අවසන් කරන ලද පැමිණිලි සංඛ්‍යාව | | බහා තබන ලද පැමිණිලි | | නීතිපති උපදෙස් සඳහා යොමු කරන ලද පැමිණිලි |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ආරක්ෂාව ලබා දෙමින් පවතින | ආරක්ෂාව ලබා දෙන ලද පැමිණිලි | ආරක්ෂාව ලබා දී අවසන් කරන ලද පැමිණිලි | අවසන් කරන ලද පැමිණිලි | ආරක්ෂාව ලබා දී බහා තබන ලද පැමිණිලි | බහා තබන ලද පැමිණිලි | |
| 2016 | 08 | 0 | - | 01 | 01 | 04 | - | 01 | 01 |
| 2017 | 15 | 0 | 01 | - | 01 | 11 | - | 02 | - |
| 2018 | 27 | 04 | 07 | - | 01 | 12 | 02 | 01 | - |
| 2019 | 91 | 25 | 25 | 02 | 01 | 32 | 01 | 05 | - |
| 2020 | 52 | 36 | 14 | - | - | 02 | - | - | - |
| එකතුව | 193 | 65 | 47 | 03 | 04 | 61 | 03 | 09 | 01 |

- ඉහත පැමිණිලි අතුරින් විමර්ශනය වෙමින් පවතින පැමිණිලි සම්බන්ධයෙන් අදාල තර්ජන තක්සේරු වාර්තා ලැබෙන තෙක් අන්තර් ආරක්ෂාවක් ලබා දීමට කටයුතු කර ඇත.
- 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 24 වන වගන්තිය ප්‍රකාරව අධිකරණ සහ කොමිෂන් සභා නියෝග සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන්නේ රැකවරණ අංශය විසින් වන අතර 2020 වර්ෂය සඳහා කොමිෂන් සභා නියෝග 38 ක් සහ අධිකරණ නියෝග 5ක් අධිකාරිය වෙත ලැබී ඇත. එමෙන්ම 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ලැබී ඇති අධිකරණ සහ කොමිෂන් සභා නියෝග වලට අදාලව අවසන්ව නොමැති ලිපිගොනු සම්බන්ධයෙන් 2020 වර්ෂයේදී ද අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර එකී නියෝග වලට අදාලව රැකවරණ අංශය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

| වර්ෂය | කොමිෂන් සභා නියෝග ගණන | අධිකරණ නියෝග ගණන | ආරක්ෂාව ලබා දෙමින් පවතින නියෝග | තර්ජන තක්සේරු සඳහා යොමු කර ඇති සහ අන්තර් ආරක්ෂාව ලබා දීමට උපදෙස් ලබා දී ඇති නියෝග | තර්ජන තක්සේරු සඳහා පොලිස් කොට්ඨාසය වෙත යොමු කර ඇති නියෝග | තර්ජන තක්සේරු වාර්තා ප්‍රකාරව තර්ජනයක් පවතින බැවින් ආරක්ෂාව ලබා දෙන නියෝග | ආරක්ෂාව ලබා දී බහා තබන ලද නියෝග | බහා ලබන ලද නියෝග | බහා තැබීමෙන් පසු නැවත විවෘත කරන ලද නියෝග | අවසන් කිරීමෙන් පසු නැවත විවෘත කරන ලද නියෝග | ආරක්ෂාව ලබා දී අවසන් කරන ලද නියෝග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2016 | - | - | - | - | - | - | - | - | - | - | - |
| 2017 | 01 | - | - | - | - | - | - | - | - | 01 | - |
| 2018 | 02 | - | - | - | - | - | - | - | 01 | - | 01 |
| 2019 | 10 | 01 | 05 | - | - | - | 05 | - | - | - | 01 |
| 2020 | 38 | 05 | 09 | 17 | 02 | 02 | 02 | 11 | - | - | - |
| Total | 51 | 06 | 14 | 17 | 02 | 02 | 07 | 11 | 01 | 01 | 02 |

- තවද 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 4(1) වගන්තිය ප්‍රකාරව අධිකරණ හෝ අර්ධ අධිකරණ කටයුත්තකට සහභාගී වීම සඳහා අධිකරණය වෙත යාමේදී ආහාර, නවාතැන් සහ ප්‍රවාහනය වෙනුවෙන් වැය වන වියදම් අධිකාරියේ ආරක්ෂණ අරමුදලෙන් ගෙවන ලෙස අධිකරණයෙන් ඉල්ලීමක් ලද විට උපරිමය රුපියල් පන්දහසකට යටත්ව එම වියදම් ගෙවීමට 2019.11.15 වන දින පැවති අධිකාරියේ කළමණාකරණ මණ්ඩල රැස්වීමේදී තීරණය කරන ලදී. එවැනි ඉල්ලම් දෙකක් 2020 වර්ෂයේ ඉදිරිපත් වූ අතර ඒ සඳහා මුදල් ලබා දීම සිදු කෙරුණි.

# ප්‍රතිපත්ති හා වැඩසටහන් අංශය

2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ (පනතෙහි (13) වගන්තිය) අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ මෙහෙවර සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් පිලිබඳ ඔවුන් මෙන්ම සිසුන්ද ඇතුලත්ව මහජනයා දැනුවත් කිරීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කිරීම හා ඒ සඳහා අවශ්‍ය කරන වැඩසටහන් හා ප්‍රතිපත්ති සම්බන්ධ විශේෂ සහය සැපයීම 2020 වර්ෂය තුල පහත පරිදි විය.

## 1. දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

- ජනමාධ්‍යවේදීන් සහ ජනමාධ්‍ය ආයතන ප්‍රධානීන් 86 ගේ සහභාගිත්වයෙන් අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් 2020 ජනවාරි 9 වන දින බත්තරමුල්ලේ Waters' Edge හෝටලයේදී පවත්වන ලදී. මේ සඳහා මූල්‍ය දායකත්වය UNDP ආයතනය දරන ලද අතර සංවිධාන කටයුතු අප අධිකාරිය ජනමාධ්‍ය අමාත්‍යංශය සමග එකතුව මෙම වැඩසටහන දවස පුරා මෙම විෂය පිළිබඳව ප්‍රවීනයන්ගේ සම්පත් දායකත්වයෙන් ඉතා සාර්ථකව සිදු කරන ලදී.
- ප්‍රජාවිශෝධන, ළමා හිමිකම් ප්‍රවර්ධන, පරිවාස නිලධාරීන්හට සහ බස්නාහිර පලාතේ අපරාධ, සුලු පැමිණිලි සහ කාන්තා හා ළමාකටයුතු පොලිස් ස්ථානාධිපතිවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් කිරීමට බලාපොරොත්තු වුවද Covid-19 වසංගත තත්වය සහ අධිකාරියේ එවකට කළමණාකරන මණ්ඩලයක් පත්කර නොමැති වීම යන හේතු මත ඒවා කිරීමට නොහැකි විය.
- 2020 නොවැම්බර් මස අධිකාරියට කලමණාකරන මණ්ඩලයක් පත් කරන ලද අතර අධිකාරියේ වැඩ කටයුතු පහසුවෙන් ඉදිරියට කරගෙන යාමේ අදිටනින් 2020 දෙසැම්බර් 19 වන දින තාක්ෂණික වැඩමුළුවක් කලමණාකරන මණ්ඩලයේ සාමාජිකයින් සහ තාක්ෂණික අංශයන්හි අධ්‍යක්ෂකවරුන්ගේ මෙන්ම පොලිස් ආරක්ෂක කොට්ඨාශයේ ඉහල නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලදි. මේ සඳහා අධිකාරියේ සභාපතිතුමා සහ කලමණාකරන මණ්ඩලයේ සාමාජිකයින් මෙන්ම UNDP ආයතනයේ තාක්ෂණික විශේෂඥතුමිය ද දේශන සඳහා සම්පත් දායකත්වය ලබා දෙන ලදී.

## 2. පාසැල්, පොලිස් ස්ථාන, අධිකරණ සංකීර්ණ පරිශ්‍රයන් වලට පොස්ටර් බෙදා හැරීම හා ප්‍රදර්ශනය කිරීම

- දිවයිනේ සියලුම ජාතික පාසල් (353) සඳහා සිංහල සහ දෙමළ පොස්ටර් 862 ජනවාරි මස පැවති විදුහල්පතිවරුගේ සම්මේලනයේදි ඔවුන් දැනුවත් කර බෙදා දුන් අතර දැන් ඒවා එම පාසල් වල දැන්වීම් පුවරුවල ප්‍රදර්ශනය කෙරේ. තවද සියලුම පළාත් පාසල් (10,366) අයත් පළාත්හි අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් හමුවී (උතුරු පළාත හැර) ඔවුන් දැනුවත් කරමින් සිංහල සහ දෙමළ පොස්ටර් 13,000 පමණ බෙදා දුන් අතර දැන් ඒවා එම පාසල් වල දැන්වීම් පුවරුවල ප්‍රදර්ශනය කෙරේ.
- දිවයිනේ සියලුම පොලිස් ස්ථානයන් (492) සඳහා සිංහල සහ දෙමළ පොස්ටර් 2,000 පමණ අදාල පලාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් හමුවී (උතුරු පළාත හැර) ඔවුන් දැනුවත් කරමින් ලබා දුන් අතර දැන් ඒවා එම පොලිස් ස්ථානයන් වල දැන්වීම් පුවරුවල ප්‍රදර්ශනය කෙරේ.

- අධිකරණ සංකීර්ණ 185කට (දිස්ත්‍රික් උසාවි, මහේස්ත්‍රාත් උසාවි, ආදිය) සිංහල සහ දෙමළ පොස්ටර් 800 පමණ ලබා දුන් අතර දැන් ඒවා එම පරිශ්‍රයන් වල දැන්වීම් පුවරුවල ප්‍රදර්ශනය කෙරේ.

**3. අධිකාරියේ වාර්ෂික වාර්තා සකස් කිරීම සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම**

- අධිකාරියේ අවසන් කරන ලද 2017 වාර්ෂික වාර්තාවේ CD 260 සහ මුද්‍රණය කරන ලද පිටපත් 40ක් 2020 ජනවාරි මස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.
- අධිකාරියේ 2018 වාර්ෂික වාර්තාව පිලියෙළ කර අධිකරණ අමාංශය හරහා කැබිනට් මණ්ඩලයට 2020 අගෝස්තු මස ඉදිරිපත් කරන ලදී.
- අධිකාරියේ 2019 වාර්ෂික වාර්තාව පිලියෙළ කර අධිකරණ අමාංශය හරහා කැබිනට් මණ්ඩලයට 2020 ඔක්තෝම්බර් මස ඉදිරිපත් කරන ලදී.

**4. 1985 ක්ෂනික දුරකථන සේවාව සදහා Call Centre පහසුකම් අධිකාරියේ ස්ථාපිත කිරිම**

- අධිකාරියේ මෙම Call Centre පහසුකම් ස්ථාපිත කිරිමට අවශ්‍ය වන පහසුකම් සූදානම් කලද මෘදුකාංග සහ දෘඩාංග සදහා මුල්‍ය අනුග්‍රහය UNDP ආයතනයෙන් ලබාදීමට එකඟ වූවද අධිකාරියේ කළමණාකරන මණ්ඩලයේ අවසරය ඒ සදහා අවශ්‍ය වූ බැවින් වුවද ඒ වන තෙක් කළමණාකරන මණ්ඩලය පත්කර නොමැති බැවින් මෙය නතර කිරීමට තීරණය කරන ලදී.

**5. වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහය දීමේ සහ ආරක්ෂා කිරීම පිළිබදව පර්යේෂණ සිදු කිරීම හා මධ්‍යස්ථානය ස්ථාපිත කිරිම**

- පර්යේෂණ මධ්‍යස්ථානය ස්ථාපිත කිරිම සදහා පොත්පත් මිලදී ගැනීම සිදු විය.
- UNDP ආයතනය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අපරාධ විද්‍යා අධ්‍යනාංශය සමග කරනු ලබන පර්යේෂණය සදහා සේවා දායකත්වය ලබා දීම

**6. අධිකාරිය සදහා වෙබ් අඩවියක් නිර්මාණය කිරීම**

- මේ සදහා සංකල්ප පත්‍රිකාව (Concept Note), යෝජනා මලාව (Proposal) සහ යොමුකිරීමේ අනුදේශ පත්‍රිකාව (Terms of Reference) සකස් කරන ලද අතර තාක්ෂණික දායකත්වය ලබා දෙන ලදී.

**2015 අංක 4 දරන පනත පිළිබඳව ජනමාධ්‍යවේදීන් සහ ජනමාධ්‍ය ආයතන ප්‍රධානීන් දැනුවත් කිරීමේ වැඩසටහන**

දිනය - 2020.01.09

ස්ථානය - බත්තරමුල්ල වෝටර්ස් ඒඩ්ජ් හෝටලය　　　　නිලධාරීන් සංඛ්‍යාව - 86















# මූල්‍ය අංශය

# 2020.01.01 සිට 2020.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය

- 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 29 වගන්තිය ප්‍රකාරව අධිකාරියේ ආරක්ෂණ අරමුදල ස්ථාපිත කර ඇති අතර 2020 දෙසැම්බර් 31 වන විට එය රු. මිලියන 10.87 ක් දක්වා වර්ධනය වී ඇත.

**2020/12/31 දිනට අදාල ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් සාරාංශ වාර්ථාව**

| වැය විෂය හා විස්තරය | 2020 අය වැය ඇස්තමේන්තුව (ජනවාරි - දෙසැම්බර්) (රු. ) | 2020.12.31 දිනට සංශෝධිත ඇස්තමේන්තුව (රු.) | 2020.12.31 දිනට වියදම (රු. ) | ඉතිරි වීම / ඉක්මවීම (රු.) | ඉතිරි වීම / ඉක්මවීම (%) |
|---|---|---|---|---|---|
| 1503 (පුනරාවර්තන) | 45,790,000.00 | 35,790,000.00 | 36,193,581.00 | (403,581.00) | 1.12% |
| 2201 (ප්‍රාග්ධන) | 4,000,000.00 | 4,000,000.00 | 1,389,005.00 | 2,610,995.00 | 65.27% |

## 2020.12.31න් අවසන් වන වසර සඳහා වන මූල්‍ය

## ප්‍රකාශනවලට සටහන්

### ගිණුම්කරණ ප්‍රතිපත්ති

**1. සංස්ථානික තොරතුරු**

**1.1. ස්ථාපිත කිරීම හා නෛතික පසුබිම**

2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්හට සහාය දීමේ හා ආරක්ෂා කිරීමේ පනත මගින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව මගින් අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය ස්ථාපිත කරන ලද අතර, අධිකරණ අමාත්‍යාංශය යටතේ එහි සේවා සැපයෙන ක්ෂේත්‍රය පුළුල් කෙරිණි. එහි ප්‍රධාන කාර්යාලය පළමු මහළ, 428/11ඒ, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල යන ස්ථානයේ පිහිටා ඇත.

**1.2 ප්‍රධාන කාර්යයන් හා මෙහෙයුම් කටයුතුවල ස්වභාවය**

පනතෙහි අරමුණු ළඟා කර ගැනීමට අදාළව අධිකාරියේ රාජකාරි හා කාර්යයන් 2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහාය දීමේ හා ආරක්ෂා කිරීමේ පනතෙහි 13 වන වගන්තිය යටතේ ලැයිස්තුගත කර ඇත.

**1.3 සේවකයන් සංඛ්‍යාව**

2020 වසර අවසන් වන විට සේවක සංඛ්‍යාව 36ක් විය.

**2. සැකසීමේ පදනම**

**2.1 අනුකූලතා ප්‍රකාශනය**

අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරියෙහි මූල්‍ය ප්‍රකාශනය, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, සංචිත වෙනස්වීම හා මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් ආදියෙන් සමන්විත වේ. මෙම ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් දක්වා ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සකස් කරනු ලැබේ.

**2.2. ඇගයීමේ පදනම**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කරන ලදී.

මූල්‍ය ප්‍රකාශනවල උද්ධමනීය සාධක සඳහා කිසිඳු ගැලපුමක් නොකරන ලදී.

**2.2 කෘත්‍යාත්මක මුදල්**

අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරියේ කෘත්‍යාත්මක මුදල් වන ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කෙරේ.

## 3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත දක්වා ඇති මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලු කාල සීමාවන් සඳහා නිත්‍ය වශයෙන් අදාළ කර ගන්නා ලදී.

### 3.1. දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණවලට අදාළ පිරිවැය යනු අත්පත් කර ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැය සහ අපේක්ෂිත භාවිතය සඳහා අදාළ වත්කම ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීමේ දී දැරීමට වන වියදම වේ. මූලිකව වත්කම පිරිවැයට හඳුනා ගැනීමෙන් පසුව ප්‍රත්‍යාගණනයට ලක් කළ වත්කම් ඉන් පසු ක්ෂය අඩු කිරීමෙන් අනතුරුව වන ප්‍රත්‍යාගණනය කරන ලද අගය මත පවත්වාගෙන යනු ලැබේ. අනෙක් සියළු දේපළ, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂය අඩු කිරීමෙන් පසු පිරිවැයට පෙන්වනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණවල අයිතමයක් විවිධ ප්‍රයෝජනවත් ජීවකාලයන් සහිත සංරචකවලින් යුක්ත වන විට ඒවා දේපළ, පිරියත හා උපකරණවල තනි අයිතම සඳහා අදාළ කර ගනු ලැබේ.

එක් එක් මුදල් වර්ෂය අවසානයේ වත්කමෙහි ශේෂ අගයන්, ප්‍රයෝජනවත් ජීව කාල හා ක්ෂය වීමේ ක්‍රම සමාලෝචනය කර යෝග්‍ය නම් ගලපනු ලැබේ.

**ප්‍රදානයන් ලෙස ලද දේපළ, පිරියත හා උපකරණ**

ඕනෑම ප්‍රදානයක් යටතේ අත්පත් කර ගත් දේපළ, පිරියත හා උපකරණයක පිරිවැයට ප්‍රාග්ධනිත කෙරේ.

සින්නක්කර ඉඩම් හැර අනෙක් සියළු දේපළ, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂය අඩු කිරීමෙන් පසු පිරිවැයට පෙන්වනු ලැබේ. සින්නක්කර ඉඩම් පිරිවැයට පෙන්වනු ලැබේ.

සින්නක්කර ඉඩම් හැර සියලු දේපළ, පිරියත හා උපකරණ මත ක්ෂය ගණනය කරනු ලබන්නේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරාවට පිරිවැය කපා හැරීම සඳහා ය.

වසර සඳහා ක්ෂය වෙන් කරන ලද්දේ සමානුපාතික පදනම මත ය.

පහත දක්වා ඇති පරිදි දේපළ, පිරියත හා උපකරණ ක්ෂය කරනු ලබන්නේ සියලු මාර්ග ක්‍රමය මත යි. තවද සියළු දේපළ, පිරියත හා උපකරණ SLPSAS 7 - දේපළ, පිරියත හා උපකරණ යටතේ දක්වා ඇති පිරිවැය ක්‍රමය මත ගිණුම් තබන ලදී.

| | | |
|---|---|---|
| 1. | පරිගණක හා උපාංග | 25% |
| 2. | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 10% |
| 3. | කාර්යාල පරිශ්‍රය | 4% |
| 4. | මෘදුකාංග | 25% |
| 5. | වෙනත් | 10% |

දේපළ, පිරියත හා උපකරණවලට අයත් අයිතමයක් ඉවත් කරනු ලබන්නේ බැහැර කිරීමේ දී හෝ එහි භාවිතය හෝ බැහැර කිරීම තුළින් කිසිඳු අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන අවස්ථාවකදී ය. වත්කමක් ඉවත් කිරීමේ දී සිදු වන ලාභයක් හෝ පාඩුවක් (ඉවත් කිරීම්වලින් ශුද්ධ ලැබෙන මුදල හා වත්කම දරන ලද අගය අතර වෙනස ලෙස ගණනය කළ) වත්කම ඉවත් කරන වසරෙහි ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කරනු ලැබේ.

මූලිකව තක්සේරු කරන ලද කාර්යසාධන ප්‍රමිති මගින් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ පවත්වාගෙන යාමේ අරමුණින් දේපළ, පිරියත හා උපකරණව අළුත්වැඩියා කිරීම හෝ නඩත්තුව සඳහා වන වියදම එය ඇති වූ අවස්ථාවේ දී වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ.

### 3.2 භාණ්ඩ තොගය

මූල්‍ය වර්ෂය තුළ භාවිතා කරනු ලබන භාණ්ඩ තොගය ආදායම් හා වියදම් ප්‍රකාශනයේ පිරිවැයට අගය කර ඇත.

පිරිවැය, විකුණුම් මිළ හෝ ශුද්ධ උපලබ්ධි අගය යන තුනෙන් වඩා අඩු අගය මත ඉතිරි භාණ්ඩ තොගය අගය කරනු ලැබේ.

### 3.3. මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ, අතැති මුදල් හා බැංකුවෙහි ඇති මුදල්වලින් සමන්විත වේ.

### 3.4. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කරන ලදී.

### 3.5. වගකීම් හා වෙන් කිරීම්

පසුගිය සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස වර්තමාන බැඳීමක් ඇති විට ශේෂ පත්‍රයෙහි වගකීම් හඳුනා ගනු ලබන අතර එය නිරවුල් කිරීමේ දී ආර්ථික ප්‍රතිලාභ සහිත සම්පත් ගලා යාමක් සිදු වෙතැයි අපේක්ෂා කෙරේ. ණය හිමියන්ගේ ඉල්ලීම මත හෝ ශේෂ පත්‍රයේ දිනයේ සිට වසකර කාලයක් තුළ පියවිය හැකි බැඳීම් ශේෂ පත්‍රයෙහි ජංගම වගකීම් ලෙස සලකනු ලැබේ.

පසුගිය සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරියට විශ්වසනීය ලෙස ඇස්තමේන්තුගත කළ හැකි වර්තමාන නෛතික හෝ වැඩදායී බැඳීමක් වේ නම් හා අදාළ බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ගලා යාමක් අවශ්‍ය වේ නම් වෙන්කිරීම් හඳුනා ගත හැකිය.

### 3.6. බදුකරණය

බදු වියදම් මූල්‍ය ප්‍රකාශනයේ සටහන් කර ඇති අතර 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතෙහි සහ එහි සංශෝධනවල විධිවිධානවලට අනුව ගණනය කර ඇත.

### 3.7. සේවක ප්‍රතිලාභ

#### I. නිර්වාචිත දායකත්ව සැලැස්ම

නිර්වාචිත දායකත්ව සැලැස්ම පිළිබඳ බැඳීම සිදු කළ වියදමක් ලෙස ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගැනේ. අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය මගින් අර්ථසාධක අරමුදල හා සේවක භාර අරමුදල වෙත සේවකයන්ගේ දළ වැටුපෙන් පිළිවෙලින් 12% හා 3% දායකත්වයක් දරනු ලැබේ.

#### II. නිර්වාචිත ප්‍රතිලාභ සැලැස්ම අර්ථ දැක්වීම

පාරිතෝෂිකය යනු නිර්වාචික ප්‍රතිලාභ සැලැස්මකි. අදාළ නීතිය අනුව පාරිතෝෂිකය ගෙවීමට අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය බැඳී සිටියි. මෙම වගකීම ඉටු කිරීම සඳහා සේවය කළ පළමු වසරින් ආරම්භ කර සේවා කාලයෙහි සම්පූර්ණ කරන එක් එක් වසර සඳහා සියළු ම සේවකයන්ගේ පසුගිය මුදල් වර්ෂයෙහි අවසන් වරට ලබා ගත් අඩ මසක වැටුප මත පදනම්ව ගණනය කරන මුදලට සමාන ප්‍රතිපාදනයක් ශේෂ පත්‍රයෙහි ඉදිරියට ගෙන එනු ලැබේ.

1983 අංක 12 දරන පාරිතෝෂිකය ගෙවීමේ පනත යටතේ ගෙවිය හැකි පාරිතෝෂිකයට අදාළව සියළු සේවකයන් සඳහා විශ්‍රාමික පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන වෙන් කෙරේ. මෙම අයිතමය ශේෂ පත්‍රයෙහි ජංගම නොවන වගකීම් යටතේ කාණ්ඩ ගත කෙරේ.

මහා භාණ්ඩාගාරයට අනුව ඔවුන් අවශ්‍ය වූ විට අරමුදල් පිරිනමන බැවින් මේ සඳහා අරමුදලක් අවශ්‍ය නොවේ.

**3.8. අධිකාරියේ අරමුදල්**

පනතෙහි 18 හා 29 වන වගන්තීන් ප්‍රකාරව අරමුදල් දෙකක් (2) අධිකාරිය සතුවේ.

**1. අධිකාරියේ අරමුදල**

මෙම අරමුදල සඳහා පහත අයුරින් මුදල් බැර කළ යුතුය.

- අධිකාරියේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් වරින් වර සම්මත කෙරෙන සියලුම මුදල්

හා

-පරිත්‍යාගයන්, ත්‍යාග, පැවරීම් හා ප්‍රදානයන් ලෙස ශ්‍රී ලංකාව තුළ හා ඉන් පිටත මූලාශ්‍රයන්ගෙන් ලැබෙන අධිකාරිය වෙත ලැබෙන සියලු මුදල්.

පනත යටතේ අධිකාරියේ රාජකාරි හා කාර්යයන් ඉටු කිරීමේ දී සිදු වන වියදම් අධිකාරියේ අරමුදලින් ගෙවිය යුත්තේ ය.

**2. ආරක්ෂක අරමුදල**

ආරක්ෂක අරමුදල සඳහා මුදල් බැර කිරීම පහත පරිදි සිදු කළ යුත්තේ ය.

-අරමුදල සඳහා පාර්ලිමේන්තුව විසින් සම්මත කෙරෙන සියලු මුදල්;

- පරිත්‍යාගයන්, ත්‍යාග, පැවරීම් හා ප්‍රදානයන් ලෙස දේශීය හා විදේශීය මූලාශ්‍රයන්ගෙන් අධිකාරිය වෙත ලැබෙන ආරක්ෂක අරමුදල වෙත ප්‍රේෂණය කිරීමට නියමිත සියලු මුදල්.

-28 වන වගන්තියෙහි (1) (අ) (ii) උප වගන්ති යටතේ අධිකරණය විසින් ප්‍රේෂණය කෙරෙන සියලු මුදල්.

-29 වන වගන්තියෙහි (4) (අ) හා (ආ) උප වගන්ති යටතේ වන ගෙවීම් සඳහා මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට ආරක්ෂක අරමුදලින් ගෙවීම් සිදු කෙරේ.

**3.9. ආදායම හඳුනාගැනීම**

**3.9.1 ආදායම හඳුනාගැනීම**

වන වගන්තියෙහි (1) (අ) (ii) උප වගන්ති යටතේ අධිකරණය විසින් ප්‍රේෂණය කෙරෙන සියලු මුදල් ලැබීමේ පදනම මත ගණනය කරනු ලබන අතර පොළිය හා වෙනත් සියලු ආදායම් උපචිත පදනම මත ගණනය කෙරේ.

**3.9.2 වියදම**

මණ්ඩලය පවත්වාගෙන යාමේ දී දරන ලද සියලු වියදම් උපචිත පදනම මත ගණනය කරන ලද අතර මණ්ඩලයේ ඉපයීමේ ධාරිතාව පවත්වාගෙන යාම හෝ ඉහළ නැංවීම සඳහා ස්ථාවර ස්වභාවයේ වත්කම් අත්පත් කරගැනීම, ව්‍යාප්ත කිරීම හෝ සංවර්ධනය කිරීමට අදාළව දරන ලද සියලු වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබීය.

**3.10. සංසන්දනාත්මක තොරතුරු**

අවශ්‍ය වූ විට වර්තමාන වසරේ ඉදිරිපත් කිරීමට අනුකූල වන පරිදි සංසන්දනාත්මක සංඛ්‍යාවන් යළි සකස් කරන ලදී.

**3.11. ශේෂ පත්‍ර දිනයට පසු සිදුවීම්**

ශේෂ පත්‍රයට පෙර සියළු සිදුවීම් සලකා බලන ලද අතර යෝග්‍ය අවස්ථාවල දී මූල්‍ය ප්‍රකාශනයට අදාළව ගැලපීම් හෝ අනාවරණයන් සිදු කරන ලදී.

**3.12. වගකීම් හා අවිනිශ්චිතතාවන්**

අවිනිශ්චිතතාවන් යනු පසුගිය සිදුවීම්වලට අදාළ වත්කම් හෝ බැදීම් වන අතර මණ්ඩලයේ පාලනයෙන් ඔබ්බට වන අවිනිශ්චිත අනාගත සිදුවීම් ඇති වීම හෝ ඇති නොවීම මත තහවුරු කරනු ලැබේ.

**3.13. ප්‍රදානයන් ගිණුම්ගත කිරීම**

i.රාජ්‍ය ප්‍රදානයන්

ඉදිරිපත් කිරීමේ ක්‍රම ඇතුළු රාජ්‍ය ප්‍රදානයන් සඳහා භාවිතා කරන ගිණුම්කරණ ප්‍රතිපත්තිය පහත පරිදි වේ.

අ. වත්කම් මිළ දී ගැනීම සඳහා වන රාජ්‍ය ප්‍රදානයන් වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරාවට ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ.

ආ. ලැබෙන වෙනත් ප්‍රදානයන් මෙන් ම ඉන් පසු සිදුව ඇති වන වියදම් ලාභ හා පාඩුවල ඇතුළත් කරන ලදී.

**3.14. ආයෝජනය**

යෝග්‍ය හා ආරක්ෂිත ආකාරයට එහි අරමුදල වෙත බැර කර ඇති මුදල් ආයෝජනය කිරීම, බැංකුවෙහි ජංගම, ඉතුරුම් හො තැන්පතු ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම පිළිබඳ 14 වන වගන්තියෙහි (ආ) උප වගන්තිය යටතේ විස්තර කෙරේ.

පනතට අනුකූල වන පරිදි එහි අරමුදලට බැර කරන ලද මුදල් යෝග්‍ය හා ආරක්ෂිත ආකාරයට මූල්‍ය උපකරණවල ආයෝජනය කරනු ලැබේ. එම ආයෝජන පිරිවැය පදනම මත ගිණුම්ගත කරනු ලබන අතර එවැනි ආයෝජන මගින් උපයන ආදායම උපචිත පදනම මත ගිණුම්ගත කරනු ලැබේ.

**අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය**
**2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන් අංක | 2020 රුපියල් | 2019 රුපියල් |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| අතැති මුදල් හා බැංකුවෙහි ඇති මුදල් | **08** | 3,022,818 | 4,749,968 |
| බැරකම් | **09** | 30,000 | 30,000 |
| අනෙකුත් වත්කම් | **10** | 1,436,940 | 1,578,031 |
| **මුළු ජංගම වත්කම්** | | **4,489,758** | **6,357,999** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| **ආයෝජන** | **11** | 10,036,192 | 2,163,300 |
| දේපළ, පිරියත හා උපකරණ | **12** | 17,274,667 | 19,657,940 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **27,310,859** | **21,821,240** |
| **මුළු වත්කම්** | | **31,800,617** | **28,179,239** |
| අඩු කළා: | | | |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | **13** | **1,571,290** | **1.238,653** |
| **මුළු ජංගම වගකීම්** | | **1,571,290** | **1.238,653** |
| **ශුද්ධ ජංගම වත්කම්** | | **2,918,467** | **5,119,347** |
| **ජංගම නොවන වගකීම්** | **14** | **1,999,175** | **1,033,949** |
| **මුළු වගකීම්** | | **3,570,465** | **2,272,601** |
| **මුළු ශුද්ධ වත්කම්** | | **28,230,151** | **25,906,638** |
| **මූල්‍යනය සිදු කළේ පහත ආකාරයටයි** | | | |
| සමුච්චිත අරමුදල | **15** | (1.687,777) | 1,031,556 |
| **අධිකාරියේ ආරක්ෂණ අරමුදල** | **16** | 10,870,309 | 3,963,140 |
| රාජ්‍ය ප්‍රදානයන් | **17** | 14,475,118 | 14,806,284 |
| UNDP ප්‍රදානයන් | **18** | 4,572,501 | 6,105,648 |
| | | **28,230,151** | **25,906,638** |

"පිටු අංක 1- 5 දක්වා වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ, පිටු අංක 10 සිට 15 දක්වා වන සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශයේ වැදගත් කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශයන් සකස්කිරීමේ සහ ඉදිපත්කිරීමේ වගකීම කළමනාකරණ මණ්ඩලය වගකියනු ලැබේ. මෙම මූල්‍ය ප්‍රකාශයන් කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කර අත්සන් තබා ඇත.

අත්සන් කළේ:

| | | |
|---|---|---|
| ජී.ඩී.ආර්.පෙරේරා<br>අධ්‍යක්ෂ (මූල්‍ය ) | උදයකුමාර අමරසිංහ<br>අධ්‍යක්ෂ ජනරාල් | සුහද කේ. ගමලත්<br>සභාපති |

| | |
|---|---|
| වෛද්‍ය නීල් ප්‍රනාන්දු | එන්.එච්.එම්.ඩබ්.ඩබ්.එන් හේරත් |
| කළමනාකරණ මණ්ඩල සාමාජික | කළමනාකරණ මණ්ඩල සාමාජික |

**අපරාධයක වින්දිතයන්හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය**

2020 දෙසැම්බර් 31න් අවසන් වන වසරෙහි මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| | සටහන් අංක | 2020 රුපියල් | 2019 රුපියල් |
|---|---|---|---|
| **ආදායම** | **1** | | |
| ප්‍රදානයන් | **1.1** | 34,498,500 | 38, 964,130 |
| වෙනත් ආදායම් | **1.2** | 3,794,313 | 18,749,310 |
| **මුළු ආදායම** | | **38,292,813** | **57,713,440** |
| **මෙහෙයුම් වියදම්** | | | |
| පුද්ගලික වේතන | **2** | 29,871,329 | 28,155,264 |
| ගමන් වියදම් | **3** | 206,025 | 242,668 |
| සැපයුම් හා පාරිභෝගික භාණ්ඩ | **4** | 2,683,763 | 4,193,854 |
| නඩත්තුව | **5** | 2,555,493 | 3,458,610 |
| ගිවිසුම්ගත සේවාවන් | **6** | 2,256,233 | 18,400,264 |
| ක්ෂය වීම | **7** | 3,439,313 | 2,719,015 |
| **මුළු වියදම්** | | **41,012,156** | **57,169,675** |
| **අදාළ කාල සීමාව අතිරික්තය/ (හිඟය)** | | **(2,719,343)** | **543,765** |

**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය**

2020.12.31න් අවසන් වන වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | | 2020<br>රුපියල් | 2019<br>රුපියල් |
|---|---|---|---|
| <u>**මෙහෙයුම් කටයුතු මගින් සිදුවන මුදල් ප්‍රවාහය**</u> | | | |
| වසර සඳහා වන අතිරික්තය/ (හිඟය) | | (2,719,343) | 543,765 |
| අඩු කළා: | ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය | - | - |
| | ප්‍රාග්ධන ප්‍රදානය ක්‍රමාක්ෂය කිරීම | (3,624,313) | (18,500,810) |
| එකතු කළා : | වසර සඳහා ක්ෂය වීම | 3,439,313 | 2,719,015 |
| | පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 965,226 | 593,544 |
| **කාරක ප්‍රාග්ධනයට පෙර මෙහෙයුම් අතිරික්තය/ (හිඟය)** | | **(1,939,117)** | **(14,644,486)** |
| | භාණ්ඩ තොග වැඩිවීම | 327,997 | (365,876) |
| | වෙළඳ හා වෙනත් ලැබීම් වැඩි වීම (අඩු වීම) | (186,906) | (52,435) |
| | පෙර ගෙවීම් ඉහළ යාම | - | (15,000) |
| | උපචිත වියදම් හා ගෙවිය හැකි දේ වැඩි වීම | 332,638 | 992,138 |
| | වසර තුළ ගෙවන ලද පාරිතෝෂික | - | - |
| | | **473,729** | **558,827** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(1,465,388)** | **(14,085,658)** |
| **ආයෝජන කටයුතු මගින් වන මුදල් ප්‍රවාහය** | | | |
| | ස්ථාවර වත්කම් මිල දී ගැනීම | (1,056,040) | (6,894,213) |
| | ස්ථාවර වත්කම් විකිණීමෙන් ලබන මුදල් ආයෝජනය | - | - |
| | ආයෝජන | (7,872,892) | (2,163,300) |
| **ආයෝජන කටයුතු මගින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(8,928,931)** | **(9,057,513)** |
| **මූල්‍ය කටයුතු මගින් වන මුදල් ප්‍රවාහය** | | | |
| | අභ්‍යන්තර අරමුදල සඳහා ශුද්ධ ලැබීම් | 6,907,169 | 3,407,340 |
| | ප්‍රාග්ධන ප්‍රදාන | 1,760,000 | 23,930,000 |
| **මූල්‍ය කටයුතු මගින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **8,667,169** | **27,337,340** |
| **භාවිතා කළ ශුද්ධ මුදල් ප්‍රමාණය** | | **(1,727,150)** | **4,194,168** |
| **2020.01.01 දිනට මුදල් හා මුදල් සමාන දෑ** | | **4,749,968** | 555,800 |
| **2020 .12.31 දිනට මුදල් හා මුදල් සමාන දෑ** | | **3,022,818** | **4,749,968** |

අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය

**2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා සංචිතයන්හි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය**

| | අරමුදල් (රු) | ප්‍රදානයන් (රු) | සමුච්චිත අරමුදල හා සංචිත (රු) | එකතුව (රු) |
|---|---|---|---|---|
| 2019 ජනවාරි 1 දිනට ශේෂය | 555,800 | 15,482,742 | 487,801 | 16,526,343 |
| වසර තුළ අය කිරීම් | - | 23,930,000 | 543,765 | 24,473,765 |
| වසර තුළ මාරු කිරීම් | 3,407,340 | (18,500,810) | - | (15,093,470) |
| 2019 දෙසැම්බර් 31 දිනට ශේෂය | **3,963,140** | **20,911,932** | **1,031,566** | **25,906,638** |
| 2020 ජනවාරි 1 දිනට ශේෂය | 3,963,140 | 20,911,932 | 1,031,566 | 25,906,638 |
| වසර තුළ අය කිරීම් | - | 1,760,000 | (2,719,343) | (959,343) |
| වසර තුළ මාරු කිරීම් | 6,907,169 | (3,624,313) | - | 3,282,856 |
| 2020 දෙසැම්බර් 31 දිනට ශේෂය | **10,870,309** | **19,047,619** | **(1,687,777)** | **28,230,151** |

## <u>මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්</u>

| 01 සටහන<br>ආදායම | 2020<br>(රු) | 2019<br>(රු) |
|---|---|---|
| **1.1 - <u>ප්‍රදානයන්</u>** | | |
| <u>රාජ්‍ය ප්‍රදානයන්- පුනරාවර්තන</u> | | |
| වර්ෂය තුළ ලැබීම් | 34,498,500 | 38,964,130 |
| වර්ෂය තුළ ආපසු ගෙවීම් | - | |
| | 34,498,500 | 38,964,130 |
| **1.2 - වෙනත් ආදායම්** | | |
| <u>වෙනත් ආදායම</u> | | |
| වර්ෂය තුළ ලැබීම් | 170,000 | 248,500 |
| වර්ෂය තුළ ආපසු ගෙවීම් | - | - |
| | 170,000 | 248,500 |
| <u>විලම්භිත ආදායම්</u> | | |
| විලම්භිත ආදායම - රාජ්‍ය ප්‍රදානයන් | 2,091,166 | 4,063,684 |
| විලම්භිත ආදායම -UNDP ප්‍රදානයන් | 1,533,147 | 14,437,126 |
| | 3,624,313 | 18,500,810 |
| මුළු ආදායම | **38,292,813** | **57,713,440** |

****2020 වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් වෙනුවෙන් අධිකාරිය සඳහා රු. 45,790,000.00 ක මුදලක් වෙන් කර ඇත. නමුත්, 2020 වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් වශයෙන් අවශ්‍යය වුයේ රු. 35,790,000.00 ක මුදලක් පමණක් වූ අතර ඉතිරි වූ රු. 10, 000, 000.00 ක මුදල, රේඛීය අමාත්‍යංශය සඳහා නැවත වෙන් කරන ලදී.**

| **02** සටහන<br>**වියදම්** | 2020<br>(රු) | 2019<br>(රු) |
|---|---|---|
| **පුද්ගලික වේතන** | | |
| වැටුප් හා වේතන | 17,748,718 | 14,269,541 |
| සේවක අර්ථසාධක අරමුදල | 2,465,150 | 2,095,156 |
| සේවක භාර අරමුදල | 616,287 | 523,789 |
| අතිකාල හා නිවාඩු දින ගෙවීම් | 442,605 | 1,156,276 |
| පාරිතෝෂික | 965,226 | 593,544 |
| වැඩ බලන දීමනා | - | 52,210 |
| ගමන් දීමනා | 2,561,000 | 1,833,871 |
| ඉන්ධන දීමනා | 1,198,902 | 1,135,290 |
| ජීවන වියදම් දීමනා | 3,258,840 | 3,055,516 |
| ගැලපුම් දීමනා | - | 391,921 |
| වෘත්තීය දීමනා | 275,600 | 288,000 |
| කළමනාකාර මණ්ඩල දීමනා | 229,000 | 1,828,000 |
| වෙනත් දීමනා | - | 832,151 |
| පුහුණු දීමනා | 110,000 | 100,000 |
| **එකතුව** | **29,871,329** | **28,155,264** |

| **03** සටහන<br>**ගමන් වියදම්** | **2020**<br>(රු) | **2019**<br>(රු) |
|---|---|---|
| ගමන් - දේශීය | 206,025 | 214,217 |
| ගමන් - විදේශීය | - | 28,451 |
| **එකතුව** | **206,025** | **242,668** |

| **04** සටහන<br>**සැපයුම් හා පාරිභෝගික භාණ්ඩ** | **2020**<br>(රු) | **2019**<br>(රු) |
|---|---|---|
| මුද්‍රණය හා ලිපි ද්‍රව්‍ය | 526,887 | 1,297,649 |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 987,979 | 1,483,234 |
| නිල ඇඳුම් | 36,000 | 36,000 |
| විනෝද කටයුතු | 264,547 | 552,912 |
| වෙළඳ ප්‍රචාරණය | 648,961 | 736,362 |
| පුවත් පත් | 14,350 | 14,520 |
| වෙනත් සැපයුම් | 205,039 | 73,177 |
| **එකතුව** | **2,683,763** | **4,193,854** |

| **05** සටහන<br>**නඩත්තුව** | **2020**<br>(රු) | **2019**<br>(රු) |
|---|---|---|
| නඩත්තු වියදම් - වාහන | 1,811,849 | 2,282,640 |
| නඩත්තු වියදම් - පිරියත යන්ත්‍රෝපකරණ | 700,155 | 841,708 |
| නඩත්තු වියදම් - ගොඩනැගිල්ල හා ව්‍යුහය | 43,489 | 334,262 |
| **එකතුව** | **2,555,493** | **3,458,610** |

| **06** සටහන<br>**ගිවිසුම්ගත සේවාවන්** | **2020**<br>(රු) | **2019**<br>(රු) |
|---|---|---|
| ප්‍රවාහනය | 17,650 | 24,548 |
| විදුලි සංදේශ ගාස්තු | 744,213 | 764,853 |
| තැපැල් ගාස්තු | 66,555 | 74,210 |
| බැංකු ගාස්තු | - | 8,511 |
| පවිත්‍රතා ගාස්තු | 808,117 | 970,507 |
| වෙනත් සේවාවන් -රජයේ දැනුවත් කිරීමේ වැඩසටහන් | - | 2,869,192 |
| වෙනත් සේවාවන් -UNDP දැනුවත් කිරීමේ වැඩසටහන් | - | 12,912,603 |
| වෙනත් සේවාවන් - විගණන ගාස්තු | 321,278 | 744,941 |
| වෙනත් සේවාවන් - වෙනත් | 298,419 | 30,899 |
| **එකතුව** | **2,256,233** | **18,400,264** |

| 07 සටහන<br>ක්ෂය වීම | 2020<br>(රු) | 2019<br>(රු) |
|---|---|---|
| කාර්යාල පරිශ්‍ර පුනරුත්ථාපනය - රාජ්‍ය ප්‍රදානයන් | 91,855 | 81,685 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ - රාජ්‍ය ප්‍රදානයන් | 940,885 | 753,979 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ - UNDP ප්‍රදානයන් | 341,507 | 341,507 |
| පරිගණක සහ උපාංග - රාජ්‍ය ප්‍රදානයන් | 702,120 | 299,524 |
| පරිගණක සහ උපාංග - UNDP ප්‍රදානයන් | 1,162,900 | 1,162,900 |
| මෘදුකාංග සංවර්ධනය - රාජ්‍ය ප්‍රදානයන් | 171,307 | 59,305 |
| වෙනත්- UNDP ප්‍රදානයන් | 28,740 | 20,116 |
| **එකතුව** | **3,439,313** | **2,719,015** |

| 08 සටහන<br>අතැති මුදල් හා බැංකුවේ ඇති මුදල් | 2020<br>(රු) | 2019<br>(රු) |
|---|---|---|
| ලංකා බැංකුව -C/A-81479591 | 2,270,578 | 2,927,563 |
| ලංකා බැංකුව - අධිකාරියේ අරමුදල C/A-81624249 | 752,240 | 1,822,405 |
| සුළු මුදල් | - | - |
| එකතුව | **3,022,818** | **4,749,968** |

| 09 සටහන<br>තැන්පතු | 2020<br>(රු) | 2019<br>(රු) |
|---|---|---|
| ආපසු ලබාදෙන තැන්පතු - ඉන්ධන | 30,000 | 30,000 |
| **එකතුව** | **30,000** | **30,000** |

| 10 සටහන<br>වෙනත් වත්කම් | 2020<br>(රු) | 2019<br>(රු) |
|---|---|---|
| ලැබිය යුතු පොලිය- ස්ථාවර තැන්පතු | 81,877 | 52,435 |
| අත්තිකාරම් - වෙබ්අඩවිය නිර්මාණය | 157,464 | - |
| තොග | 1,197,599 | 1,525,596 |
| **එකතුව** | **1,436,940** | **1,578,031** |

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

| **11 සටහන**<br>**ආයෝජන** | **2020**<br>(රු) | **2019**<br>(රු) |
|---|---|---|
| ආයෝජන- ස්ථාවර තැන්පතු | 10,036,192 | 2,163,300 |
| **එකතුව** | **10,036,192** | **2,163,300** |

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය

**2020 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම්**

| තොරතුරු | කාර්යාල පරිශ්‍රයන් | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | පරිගණක | මෘදුකාංග | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|
| | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) |
| **2020 ජනවාරි 01 දිනට පිරිවැය** | **2,285,878** | **12,822,013** | **7,458,600** | **685,226** | **287,397** | **23,539,114** |
| එකතු කිරීම් | 85,050 | 323,321 | 539,997 | - | 107,672 | **1,056,040** |
| බැහැර කිරීම් | - | - | - | - | - | **-** |
| **2020 දෙසැම්බර් 31 දිනට පිරිවැය** | **2,370,928** | **13,145,334** | **7,998,597** | **685,226** | **395,069** | **24,595,153** |
| **2020 ජනවාරි 01 දිනට සමුච්චිත ක්ෂය** | **114,117** | **1,652,955** | **2,030,516** | **63,470** | **20,116** | **3.881,174** |
| ක්ෂය වීම | 91,855 | 1,282,392 | 1,865,020 | 171,307 | 28,740 | **3,439,313** |
| බැහැර කිරීම් | - | - | - | - | - | **-** |
| **2020 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂය** | **205,972** | **2,935,347** | **3,895,536** | **234,776** | **48,855** | **7,320,487** |
| **2020 ජනවාරි 01 දිනට ලියා හළ අගය** | **2,171,761** | **11,169,058** | **5,428,084** | **621,756** | **267,281** | **19,657,940** |
| **2020 දෙසැම්බර් 31 දිනට ලියා හළ අගය** | **2,164,956** | **10,209,987** | **4,103,061** | **450,450** | **346,213** | **17,274,667** |

**ස්ථාවර වත්කම් යටතේ ගොඩනැගිලි සහ ව්‍යුහ පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම යන්න කාර්යාල පරිශ්‍රයන් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම යනුවෙන් ප්‍රතිනාමනයකරන ලදී.

** අධිකාරිය සතුව මෝටර් රථ , පිරියත හා යන්ත්‍රෝපකරණ ආදියෙහි ස්ව අයිතියක් නොමැති බැවින් ස්ථාවර වත්කම් යටතේ ඒවායේ තොරතුරු ඉදිරිපත් නොකෙරිණි.

<u>මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්</u>

| සටහන 13<br>වෙනත් බැරකම් | 2020<br>RS | 2019<br>RS |
|---|---|---|
| උපචිත වියදම්- අනෙකුත් දීමනා | 14,500 | - |
| උපචිත වියදම් - අතිකාල | 77,270 | 76,966 |
| උපචිත වියදම් - ගමන් - දේශීය | 34,625 | 26,850 |
| උපචිත වියදම් - ඉන්ධන | 53,026 | 114,324 |
| උපචිත වියදම් - විදුලි සංදේශ | 70,847 | 63,640 |
| උපචිත වියදම් - නිවාඩු දින ගෙවීම් | 3873 | 21,866 |
| උපචිත වියදම්- පුවත් පත් | - | 2,400 |
| උපචිත වියදම්- වාහන අලුත්වැඩියා | 44,655 | 13,927 |
| උපචිත වියදම්- පවිත්‍රතා | 76,720 | 82,858 |
| උපචිත වියදම්- ප්‍රවාහන | - | 1,200 |
| උපචිත වියදම්- විනෝද කටයුතු | 5080 | - |
| උපචිත වියදම්- ප්‍රචාරණ | 535,075 | - |
| උපචිත වියදම්- වෙනත් | - | 3,000 |
| ආපසු ලබාදෙන තැන්පතු | 11,680 | 86,680 |
| ප්‍රතිපාදන - විගණන ගාස්තු | 643,939 | 744,941 |
| **එකතුව** | **1,571,290** | **1,238,652** |

| සටහන 14<br>ජංගම නොවන බැරකම් /වගකීම් | 2020<br>රු | 2019<br>රු |
|---|---|---|
| ගෙවීමට ඇති පාරිතෝෂිත (සටහන 14 (1)) | 1,999,175 | 1,033,949 |
| **එකතුව** | **1,999,175** | **1,033,949** |

| සටහන 14(1)<br>පාරිතෝෂිතය | 2020<br>රු | 2019<br>රු |
|---|---|---|
| වර්ෂාරම්භක ශේෂය | 1,033,949 | 440,404 |
| වර්ෂය සඳහා වන අයකිරීම් | 965,226 | 593,544 |
| වර්ෂය තුළ ගෙවූ පාරිතෝෂිත මුදල | - | - |
| එකතුව | 1,999,175 | 1,033,948 |

| සටහන 15<br>සමුච්චිත අරමුදල | 2020<br>රු | 2019<br>රු |
| --- | --- | --- |
| ආරම්භක ශේෂය | 1,031,566 | 487,801 |
| වර්ෂය සඳහා වන අතිරික්ත /හිඟ | (2,719,343) | 543,765 |
| **එකතුව** | **1,687,777** | **1,031,566** |

| සටහන 16<br>අධිකාරි ආරක්ෂක අරමුදල | 2020<br>රු | 2019<br>රු |
| --- | --- | --- |
| ආරම්භක ශේෂය | 3,963,140 | 555,800 |
| වර්ෂය තුළ වන මාරු කිරීම් | 6,907,169 | 3,407,340 |
| **එකතුව** | **10,870,309** | **3,963,140** |

| සටහන් 17<br>රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදානයන් | 2020<br>(රු) | 2019<br>(රු) |
|---|---|---|
| ආරම්භක ශේෂය | 14,806,284 | 8,139,968 |
| වර්ෂය තුළ ලැබීම් | 1,760,000 | 10,730,000 |
| වර්ෂය තුළ ආපසු ගෙවීම් | - | - |
| වර්ෂය තුළ විලම්භිත | (2,091,166) | (4,063,684) |
| **එකතුව** | **14,475,118** | **14,806,284** |

| සටහන 18<br>එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන ප්‍රාග්ධන ප්‍රදානයන් | 2020<br>රු | 2019<br>රු |
|---|---|---|
| ආරම්භක ශේෂය | 6,105,648 | 7,342,774 |
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ ලද ස්ථාවර වත්කම් ප්‍රදානයක් - වර්ෂය තුළ ලැබීම් | - | 287,397 |
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ ලද ප්‍රාග්ධන ප්‍රදානයන් - වර්ෂය තුළ ලැබීම් | - | 12,912,603 |
| වර්ෂය තුළ ආපසු ගෙවීම් | - | - |
| වර්ෂය තුළ විලම්භිත | (1,533,147) | (14,437,126) |
| **එකතුව** | **4,572,501** | **6,105,648** |

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය

ආයෝජන ලේඛනය

2020 .12.31 දිනට

| ආයෝජිතයා /බැංකුව | සහතික අංකය | ආයෝජන | | | | | | කාලසීමාව | වාර්ෂික පොලී අනුපාතිකය | ලැබිය යුතු මුළු පොලිය (රු.) | කල් පිරීමේදී අගය (රු.) | ලැබිය යුතු ශුද්ධ පොලිය (රු.) | ශුද්ධ කල් පිරීමේදී අගය (රු.) | ලැබිය යුතු පොලිය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | දිනය | | නව ආයෝජන | | මුහුණත අගය | ආයෝජිත මුදල | | | | | | | 2020 | 2021 | එකතුව |
| | | ආයෝජන | කල්පිරීම | නව (ලද පොලිය රු.) | නව එක්රැස්කිරීම් | | | | | | | | | | | |
| SMIB | F/010/04/0023102 | 2021 ඔක්.05 | 2021 ඔක්.05 | 214,400 | 1,822,405 | 2,163,300 | 4,200,105 | මාස 12 යි | 6.25% | 262,507 | 4,462,612 | 262,507 | 4,462,612 | 62,570 | 199,937 | 262,507 |
| SMIB | F/010/04/0023263 | 2021 දෙසැ. 10 | 2021 දෙසැ. 10 | - | 5,836,087 | | 5,836,087 | මාස 12 යි | 5.75% | 335,575 | 6,171,662 | 335,575 | 6,171,662 | 19,307 | 316,268 | 335,575 |
| | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | |
| | | | | 214,400 | 7,658,492 | 2,163,300 | 10,036,192 | | | 598,082 | 10,634,273 | 598,082 | 10,634,273 | 81,877 | 516,204 | 598,082 |

**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය**
**2020 දෙසැම්බර් 31 දින අවසන් වූ වර්ෂය සඳහා අධිකාරි ආරක්ෂණ අරමුදලේ ආදායම් වියදම් ප්‍රකාශනය**

| විස්තරය | එකතුව (රු) |
|---|---|
| <u>අධිකරණයෙන් ලද ආදායම</u> | |
| දඩ මුදල් එකතුව | 6,681,270 |
| **මුළු එකතුව (අ)** | **6,681,270** |
| **එකතු කළා : පොලී ආදායම** | 243,842 |
| **මුළු පොලිය (ආ)** | **243,842** |
| **අඩු කළා: වියදම්** | |
| බැංකු ගාස්තු | - |
| වන්දි | (17,943) |
| රඳවා ගැනීමේ බදු | - |
| **මුළු වියදම ( ඇ )** | **(17,943)** |
| | |
| **ශුද්ධ ඉතිරිය (අ) + (ආ) + ( ඇ )** | **6,907,169** |

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය
2020 දෙසැම්බර් 31 දිනට අධිකාරි ආරක්ෂණ අරමුදලේ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

| | 2020<br>(රු ) | 2019<br>(රු ) |
|---|---|---|
| **වත්කම්** | | |
| **ජංගම වත්කම්** | | |
| අතැති මුදල් හා බැංකුවේ ඇති මුදල්- C/A 81624249 | 752,240 | 1,822,405 |
| ලැබිය යුතු පොලීය- ස්ථාවර තැන්පතු | 81,877 | 52,435 |
| **මුළු ජංගම වත්කම්** | **834,117** | **1,874,840** |
| **ජංගම නොවන වත්කම්** | | |
| ආයෝජන | 10,036,192 | 2,163,300 |
| **මුළු ජංගම නොවන වත්කම්** | **10,036,192** | **2,163,300** |
| **මුළු වත්කම් එකතුව** | **10,870,309** | **4,038,140** |
| අඩු කළා: | | |
| **වගකීම්** | | |
| **ජංගම වගකීම්** | | |
| ආපසු ලබාදෙන තැන්පතු | - | 75,000 |
| **මුළු ජංගම වගකිම්** | **-** | **75,000** |
| **ශුද්ධ ජංගම වත්කම්** | **834,117** | **1,799,840** |
| **ජංගම නොවන වගකීම්** | **-** | **-** |
| **මුළු වගකීම් එකතුව** | **-** | **75,000.00** |
| **මුළු ශුද්ධ වත්කම් එකතුව** | **10,870,309** | **3,963,140** |
| **මූල්‍යනය සිදු කළේ :** | | |
| අධිකාරියේ ආරක්ෂණ අරමුදල | 10,870,309 | 3,963,140 |
| | **10,870,309** | **3,963,140** |

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. } JPA/B/NAPVCW/FA/01/20/80

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2021 ජුනි 30 දින

අධ්‍යක්ෂ ජනරාල්

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය

**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් : 01. ලේකම්, අධිකරණ අමාත්‍යාංශය

02. ලේකම්, මුදල් අමාත්‍යාංශය


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. JPA/B/NAPVCW/FA/01/20/80

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2021 ජුනි 30 දින

අධ්‍යක්ෂ ජනරාල්
අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය

**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට ( ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 අධිකාරියේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අධිකාරියේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු

කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරනලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

(අ) 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 2(i) ප්‍රකාරව රජයට අයත් වාහනවල ලියාපදිංචි අයිතිය පිළිබඳ ගැටළු නිරාකරණය කර ගැනීමට කටයුතු කළයුතු වුවද 2018 වර්ෂයේ අධිකරණ අමාත්‍යාංශයෙන් අධිකාරියට ලබාදී තිබූ වාහන 08 සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) රාජ්‍ය අංශය තුළ මානව සම්පත් සංවර්ධනය කිරීම සඳහා 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබූ අතර කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වසරකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථා සහතික කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

(අ) අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරි පනතේ, 13 (1) (ඊ) වගන්තිය ප්‍රකාරව අපරාධයක වින්දිතයන් හට පනතේ 29 වගන්තිය යටතේ පිහිටුවන ලද අරමුදලෙන් වන්දි ප්‍රදානය කිරීම සඳහා යෝජනා ක්‍රමයක් සකස් කර එය පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම සිදු කළයුතු වුවද එපරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) එසේම පනතේ 13 (1) (ට) වගන්තිය ප්‍රකාරව අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහාය සැපයීම සඳහා යෝජනා ක්‍රමයක් වැඩිදියුණු කිරීම, යොදා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම සිදු කළයුතු වුවද එපරිදි කටයුතු කර නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (ඍ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

## 3 වෙනත් කරුණු

(අ) 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුල අධිකාරියට ලැබී තිබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව 556 ක් වූ අතර අවසන් කරන ලද මුළු පැමිණිලි සංඛ්‍යාව 266 ක් විය. වර්ෂ 5 අවසානයේ අවසන් නොකර ඉතිරි වූ මුළු පැමිණිලි සංඛ්‍යාව 290 ක් වූ අතර එය ලද සමස්ථ පැමිණිලි සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස සියයට 52 ක් විය.

(ආ) අපරාධයක වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරි පනතේ 29 (4) වගන්තිය ප්‍රකාරව අපරාධයක වින්දිතයන් සඳහා ගෙවනු ලබන වන්දි හා අපරාධයක වින්දිතයෙකු මත යැපෙන්නන්ට ගෙවන වන්දි ප්‍රධාන වියදම් ලෙස සැලකෙන අතර පනතේ 2 (ඇ) වගන්තිය ප්‍රකාරව අපරාධයක වින්දිතයන්ට එරෙහිව වරදක් සිදුකිරීම නිසා වරදකරු වූ තැනැත්තන්ගෙන් වින්දිතයන් හට වන්දි මුදල් ලබාගැනීමට සැලැස්වීම අධිකාරියේ අරමුණක් ලෙසද සලකනු ලැබේ. එසේ වුවද සමාලෝචිත වර්ෂය තුළ රැස්කල දඩ මුදල රු.6,681,270 ක් වූ අතර පනතේ 29(4) වගන්තිය ප්‍රකාරව වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ වියදම් ලෙස රු.17,943 ක් පමනක් පුද්ගලයින් 4 දෙනෙක් වෙත ගෙවා තිබුණි. ඒ අනුව වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ ක්‍රමවේදය නිසි පරිදි ඉටු වේද යන්න ගැටළු සහගත විය.

(ඇ) 2019 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව ස්වංක්‍රීය සිද්ධි කළමනාකරණ පද්ධතියක් අධිකාරිය තුළ නිර්මාණය සහ ස්ථාපනය කිරීමට සැලසුම් කර තිබුණද 2021 අප්‍රේල් 27 දින වන විටත් එය ක්‍රියාත්මක කර නොතිබුණි. එසේම අධිකාරියේ අරමුණු ළඟා කර ගැනීමේදී අත්‍යාවශ්‍ය වන සහය හා රැකවරණ අංශය සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම් කාර්යය 2019 සහ 2020 වර්ෂවල ක්‍රියාකාරී සැලැසුම්වලට ඇතුළත් කර තිබුණද එම බඳවා ගැනීම් සිදුකර නොතිබුණි.

(ඈ) 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008(1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත, 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛය මගින් හඳුන්වාදී ඇති පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය 2021 අප්‍රේල් 20 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඉ) දැනට අධිකාරියේ ක්‍රියාත්මක වන 1985 දරන ක්ෂනික දුරකථන සේවාව සඳහා Call Centre පහසුකම් ස්ථාපිත කිරිමට අවශ්‍ය මෘදුකාංග සහ දෘඩාංග ලබාගැනීමට මූල්‍ය අනුග්‍රහය UNDP ආයතනයෙන් ලබා ගැනීමට හැකියාව තිබූ අතර 2019 නොවැම්බර් සිට 2020 නොවැම්බර් දක්වා කළමණාකරන මණ්ඩලයක් පත් කර නොතිබූ බැවින් අනුමැතිය ලබා ගැනීමට නොහැකිවීම නිසා එම මූල්‍ය ප්‍රදානය අධිකාරියට අහිමි වී තිබුණි.

(ඊ) එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ දෙවන අදියර යටතේ 2019 වර්ෂයේදී නිම කිරීමට සැලසුම් කර තිබූ සහය හා රැකවරණ අංශ පිහිටුවීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වූ මාර්ගෝපදේශ සංවර්ධනය කිරීම සහ සහය හා රැකවරණය ලබා දීමේ වැඩසටහන් සඳහා ප්‍රමිතිගත ප්‍රොටෝකෝලයක් සකස් කිරීමට අධිකාරියට සහාය දීම සමාලෝචිත වර්ෂය අවසාන වන විටද ඉටු කර නොතිබුණි.

(උ) අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 56 ක් හා 2020 දෙසැම්බර් 31 දින වන විට තථ්‍ය සංඛ්‍යාව 36 ක් වූ අතර ආයතනයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා සෘජුවම බලපාන පුරප්පාඩු තනතුරු 15 ක් සඳහා නිලධාරීන් බඳවා ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති